ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එමනිසා මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වැය විෂයය අංක 123-2-7-29-2104/12 (නාගරික පුණර්ජීවන ව්‍යාපෘතියට සහාය වීමේ ව්‍යාපෘතිය) වෙනුවෙන් දරන ලද රු.මිලියන 2.71 ක වියදම් අඩුවෙන් සටහන් කර තිබුණි.	අත්තිකාරම් ලැබීම් මගින් දරන ලද රු.මිලියන 2.76 ක වියදම භාණ්ඩාගාරයේ වියදම් වශයෙන් 2024 වර්ෂයේ වාර්තා නොකිරීම හා 2023 වර්ෂයට අදාල රු.මිලියන 4.53 ක් 2024 වර්ෂයේදී ව්‍යාපෘතියේ ගිණුම් වලට ගැලපීම් කර තිබීම වෙනසට හේතුවී ඇත.	වර්ෂයට අදාල නිවැරදි වියදම ගිණුම්ගත කළ යුතුය.
(ii)	යම් මුදල් වර්ෂයකදී අධිකාරී බලය නොලබා ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දරා තිබේ නම්, මුදල් රෙගුලාසි 69 (1) ප්‍රකාරව, එම වියදම අධිකාරී බලය නොලත් වියදමක් ලෙස සලකා, එය පියවීම සඳහා එළඹෙන ඊළඟ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පාර්ලිමේන්තුවෙන් යෝජනාවක් සම්මත කරවාගත යුතුය. නමුත් මෙම අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත මුදල් ප්‍රතිපාදන වෙන්කරනු ලබන වැය විෂයයන් 04 ක සීමාව ඉක්මවා 2023 වර්ෂයේදී දරන ලද රු.මිලියන 1,454.9 ක	මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වෙත 2024 දෙසැම්බර් 10 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් ලැබූ උපදෙස් මත මුදල් රෙගුලාසි 66 යටතේ අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන එම මුදල් ගෙවීමට කටයුතු කර ඇත.	ඇස්තමේන්තු ප්‍රතිපාදන සීමාව ඉක්මවූ වියදම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

වියදම් පියවීම සඳහා ඉහත පරිදි පාර්ලිමේන්තුවෙන් යෝජනාවක් සම්මත කර ගැනීමෙන් තොරව 2024 වර්ෂයේදී වැය විෂය අංක 123-02-21-09-2104-(කොළඹ අගනගර ආශ්‍රිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය) වෙත ප්‍රතිපාදිත මුදලින් රු.මිලියන 1,454.9 ක් මුදල් රෙගුලාසි අංක 66 යටතේ මාරු කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණි.		

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය (BOS) අනුව, වර්ෂය තුළ වත්කම් මිල දී ගැනීම් සහ පැවරීම් එකතුව රු.මිලියන 19,599.2 ක් වුව ද මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය අනුව මූල්‍ය වත්කම් අත්පත් කරගැනීමේ වියදම රු.මිලියන 20,107.34 ක් ලෙස දැක්වීමෙන් රු.මිලියන 508.14 ක වෙනසක් නිරීක්ෂණය විය.	භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව, වර්ෂය තුල වත්කම් මිලදී ගැනීම වශයෙන් පෙන්නුම් කරන්නේ අමාත්‍යාංශය විසින් වත්කම් අත්පත්කරගෙන අමාත්‍යාංශය විසින් ගෙවීම් කරන ලද වටිනාකම්ය. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වන්නේ අමාත්‍යාංශය මගින් ගෙවීම් කිරීමෙන් ජනිත වූ වත්කම් හා අමාත්‍යාංශය වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ විසින් දරන ලද වියදම් මගින් ජනිතවන වත්කම්වල එකතුවය.	මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හදුනා ගැනීමට හැකි වන පරිදි ගිණුම්,තොරතුරු හා ලේඛන පවත්වාගත යුතුය.

(ii)	අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත ශ්‍රී ලංකා ඉඩම් හා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2018 වර්ෂයේ ආරම්භ කරන ලද ඔලියමුල්ල හා කොලොන්නාව යන ජලය පිරිපහදු මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා 2023 හා 2024 වර්ෂවල දරන ලද පිළිවෙලින් රු.මිලියන 697.07 ක හා රු.මිලියන 1,187.28 ක වටිනාකම් පමණක් මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ කෙරීගෙන යන වැඩ යටතේ ඇතුළත් කර තිබුණි. නමුත් එම ව්‍යාපෘති සඳහා රජය විසින් දරන ලද මුළු පිරිවැය වත්කම් වාර්තාව තුළ ඇතුළත් නොවන බැවින් එම වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.	2022 වර්ෂයට පෙර මෙම ව්‍යාපෘති වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන්විමක් සිදු වී නැති බැවින් 2022 වර්ෂයට පෙර වියදම් දැරීමක් සිදුකර නැත.	මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගැනීමට හැකි වන පරිදි ගිණුම්,තොරතුරු හා ලේඛන පවත්වාගත යුතුය.

(ඇ) අත්තිකාරම් ගිණුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
හොරණ පොළ (අදියර 4) ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2024 පෙබරවාරි 05 දින ගෙවා තිබුණු රු.මිලියන 1.75 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල, 2024 වර්ෂය තුළදී අමාත්‍යාංශය විසින් අඩුකරගෙන තිබුණද එය ගිණුම්ගත නොවීම නිසා කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 1.75 ක් වැඩියෙන් දක්වා තිබුණි.	එම මුදල 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	අත්තිකාරම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඇ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය වෙනුවෙන් අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම (2104) යටතේ මුදල් රෙගුලාසි 208 මගින් දරන ලද රු.මිලියන 15,628.18 ක් අමාත්‍යාංශ වැය ශීර්ෂයට හර කර තිබුණි. එම වටිනාකම අමාත්‍යාංශයේ සමස්ථ වියදමින් සියයට 41 ක් විය. නමුත් එම වියදම සනාථ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද සාරාංශ වාර්තා මගින් එම වියදම් සන්නිරීක්ෂණය කළ නොහැකි වූ අතර එමගින් ජනිත වූ වත්කම් හඳුනාගැනීමටද නොහැකි විය.	කඳුරට දශකය සංවර්ධන ව්‍යාපෘතිය හා නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා මුදල් රෙගුලාසි 208 යටතේ වියදම් දරා ඇත. ඊට අදාල වියදම් වාර්තා මගින් සනාථ කර ඇත. නැවත පදිංචි කිරීම් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉදිරිපත් කරන ලද වියදම් වාර්තාද ඉදිරිපත් කර ඇත. ගිණුම්වල මුදල් රෙගුලාසි 208 ආකෘතිය මගින් පෙන්වා දී ඇති අනිකුත් ව්‍යාපෘතිවලට අදාල වියදම්වලට අදාල තහවුරු කිරීම්ද ඉදිරිපත් කර ඇත.	විගණන කටයුතු සඳහා අවශ්‍ය කාලීන හා නිවැරදි දත්ත හා තොරතුරු අදාල කාලසීමාව තුළ නොපමාව ඉදිරිපත් කළ යුතුය.
(ii)	මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව, 2024 ජනවාරි 01 දිනට ආරම්භක වත්කම් ශේෂයට රු.මිලියන 125,856.93 ක් වටිනා වත්කම් එකතු කර තිබුණු අතර තවත් රු.මිලියන 8,648.75 ක් වටිනා වත්කම් මාරු කරගෙන තිබුණි. නමුත් එම වත්කම් අමාත්‍යාංශ ගිණුම්වලට ගැනීමේ දී අගය තක්සේරු කරන ලද වත්කම් තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම වටිනාකම්වල නිවැරදිභාවය විගණනයේ දී පරීක්ෂා කළ නොහැකි විය.	2024 වර්ෂය තුල ආරම්භක ශේෂයට එකතු කරන ලද හා මාරු කරන ලද එම ප්‍රමාණයන් තහවුරු කිරීමට අදාල විස්තර ඉදිරිපත් කර ඇත.	විගණන කටයුතු සඳහා අවශ්‍ය කාලීන හා නිවැරදි දත්ත හා තොරතුරු අදාල කාලසීමාව තුල නොපමාව ඉදිරිපත් කල යුතුය.
(iii)	වත්කම් වර්ග 03 ක් යටතේ වර්ෂය තුළ එකතු කරන ලද රු.මිලියන 27,242.2 ක වත්කම් සම්පූර්ණයෙන්ම සහ තවත් වත්කම් වර්ග 08 කට අයත් රු.මිලියන 15,800.93 ක වත්කම්	එම වත්කම් වලට අදාල විස්තරාත්මක උපලේඛන පිලිතුරු සමග ඉදිරිපත් කර ඇත.	විගණන කටයුතු සඳහා අවශ්‍ය කාලීන හා නිවැරදි දත්ත හා තොරතුරු අදාල කාලසීමාව තුල නොපමාව ඉදිරිපත් කළ යුතුය.

	ප්‍රමාණයක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත්කර තිබුණි. නමුත් එම වත්කම් වටිනාකම්වල නිවැරදිභාවය විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය.		
(iv)	2024 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.මිලියන 47,427.18 ක් සනාථ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද CIGAS වත්කම් ලැයිස්තුව තහවුරු කර ගැනීම සඳහා එක් එක් අංශය විසින් නඩත්තු කරන වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.	මූල්‍ය නොවන වත්කම් උපලේඛන පිලිතුරු සමග ඉදිරිපත් කර ඇත.	එක් එක් අංශ විසින් නඩත්තු කරන වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(v)	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව, මුදල් තිබෙන බවට හා නිතිපතා මුදල් ලැබෙන බවට සහතික වීම පිණිස බැරකම් පිළිබඳ ලේඛන පවත්වා ගතයුතු වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය මඟින් වැය විෂයයන් 4 ක් යටතේ ඉදිරිපත්කර තිබුණු රු.මිලියන 50 ක් වටිනා බැදීම් හා බැරකම් සඳහා බැරකම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි.	අමාත්‍යාංශයේ නිවාස අංශයට අදාලව පිළියෙළ කරන ලද බැරකම් ලේඛනයේ පිටපතක් අමුණා ඇත.	විගණන කටයුතු සඳහා අවශ්‍ය කාලීන හා නිවැරදි දත්ත හා තොරතුරු අදාල කාලසීමාව තුළ නොපමාව ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	**ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය**	**මෙම වාර්තාවේ ඡේද යොමුව**
2024 මැයි 31 දිනැති සම්පිණ්ඩන විගණන වාර්තාවේ 2.1 ඡේදය	අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව පුරෝකථනය කල යුතු බව.	3.2

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කර ගැනීමේ දී වසරේ නොවැම්බර් 30 දිනට පෙර මාරු කරගත යුතු වුව ද, 123-2-21-14-2509 සහ 123-2-21-15-2509 යන වැය විෂයයන් 02 සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් රු.මිලියන 119 ක ප්‍රතිපාදන 2024 දෙසැම්බර් 31 දින මාරු කරගෙන තිබුණි. එබැවින් අක්මුදල් නොලැබීම නිසා මාරු කරගත් මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි වී තිබුණි.	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් කරන ලද ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් ගෙවීමට තිබූ බිල්පත් ප්‍රතිපූරණය කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමග සාකච්ජා කර නව වැය විෂයන් ඇති කර ගන්නා ලදී. ඒ අනුව අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සලසා ගත්තත් එම ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් 2024 වර්ෂය තුල නොලැබීම මත එම ප්‍රතිපාදන භාවිතා කර නැත.	නියමිත කාලය තුළදී අදාළ රෙගුලාසිවලට අනුකූලව ප්‍රතිපාදන මාරුකර ගැනීම තුළින් කාර්යභාරයන් කාර්යක්ෂමව හා ඵලාදායීව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 50 ට අනුකූල නොවන පරිදි අධි සහ ඌන ප්‍රතිපාදන සිදුකළ අවස්ථා පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව පුනරාවර්තන වැය විෂයන් 02 ක් වෙත ප්‍රතිපාදිත රු.මිලියන 4.8 ක් සහ ප්‍රාග්ධන වැයවිෂයන් 11 ක් සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 3,033 ක් සම්පුර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.	වර්ෂය තුල අවශ්‍යතාවයන් පැන නොනැගීම , මුදල් අමාත්‍යාංශයේ එකගතාවය නොලැබීම , ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු සිදුනොවීම මත එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිලියෙල කිරීම තුළින් ප්‍රතිපාදන හා අක්මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	පුනරාවර්ථන වැය විෂයයන් 27 ක් යටතේ ප්‍රතිපාදිත රු.මිලියන 706.34 කින් රු.මිලියන 296.34 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 34 ක් යටතේ ප්‍රතිපාදිත රු.මිලියන 36,443.26 කින් රු.මිලියන 11,076.23 ක් ලෙස එකතුව රු.මිලියන 11,372.57 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම්වල ප්‍රතිශතය සියයට 10 සිට සියයට 99 අතර පරාසයක පැවතුණි.	අපේක්ෂිත වියදම් පැනනොනැඟීම සහ අමාත්‍යාංශ පාලනයෙන් බැහැරව පැනනගින ලද හේතූන් මත ව්‍යාපෘතිවල ප්‍රගතිය ලගාකර ගැනීමට නොහැකිවීම මත ප්‍රතිපාදන ඉතිරිවී ඇත.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිලියෙල කිරීම තුළින් ප්‍රතිපාදන හා අක්මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගැනීමකින් තොරව, ප්‍රතිපාදන වෙන්කර ගැනීම හේතුවෙන් වැය විෂයයන් 04 ක් වෙත ප්‍රතිපාදිත රු.මිලියන 46.1 ක මුළු ප්‍රතිපාදනයම ද තවත් වැය විෂයයන් 06 ක් වෙත ප්‍රතිපාදිත මුදලින් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක ප්‍රතිපාදන ද මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.	භාණ්ඩාගාරය ගත් තීරණය මත වියදම් දැරීමට නොහැකිවීම, ඉන්දියානු ආධාර ලැබීමේ ප්‍රමාදය මත අදාල වියදම් ඇති නොවීම, අපේක්ෂිත වියදම් පැන නොනැගීම, ව්‍යාපෘතිවල අපේකෂිත භෞතික ප්‍රගතිය ලගා කර ගැනීමට නොැකිවීම, මුදල් අමාත්‍යාංශයේ උපදෙස් මත නිවැරදි වැය විෂයන් වෙත ප්‍රතිපාදන මාරුකිරීම වැනි හේතු මත ඉතිරිවූ ප්‍රතිපාදන අවශ්‍ය වැය විෂයන් වෙත මාරු කර ඇත.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිලියෙල කිරීම තුළින් ප්‍රතිපාදන හා අක්මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් නොකළ වැය විෂයයන් 11 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.මිලියන 1,836.4 ක ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණි.	2023 වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති 2024 වර්ෂයේදී ඉදිරියට ක්‍රියාත්මක වේද යන අවිනිශ්චිතතාවය මත ප්‍රතිපාදන වෙන්කර නොගත්තද 2024 වර්ෂයේදී එම ව්‍යාපෘති නැවතත් ක්‍රියාත්මක වීම මත අවශ්‍ය වූ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට සිදුවිය. තවද වැරදි වැයවිෂයන් වෙත වෙන්කල ප්‍රතිපාදන නිවැරදි වැයවිෂයයන්ට මාරු කර ගැනීම සිදු කර ඇත.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිලියෙල කිරීම තුළින් ප්‍රතිපාදන හා අක්මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ)	වැය විෂයයන් 04 ක් වෙත වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදිත රු.මිලියන 1,008.5 ක මුදල ප්‍රමාණවත් නොවීම නිසා එම වැය විෂයයන් 04 වෙත ප්‍රතිපාදිත මුදලටත් වඩා වැඩි ප්‍රතිශතයක් එනම් රු.මිලියන 1,014.17 ක මුදලක් මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කරගෙන තිබුණි.	වර්ෂය තුල වෙන්වූ ප්‍රතිපාදන තුල අත්‍යවශ්‍ය වියදම් කළමණාකරණය කර ගැනීමට නොහැකි වූ හේතුව මත මේ යටතේ දක්වා ඇති වැය විෂයන් 4 සඳහා අවශ්‍යය අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කර ඇත.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිලියෙල කිරීම තුළින් ප්‍රතිපාදන හා අක්මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

බැරකම් හා බැඳීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් හා බැරකම් ඇතිකර නොගත යුතු අතර ඉදිරියේ දී ප්‍රතිපාදන ලබාගැනීමේ අපේක්ෂාවෙන් කිසිදු බැඳීමක් ඇතිකර නොගත යුතුය. නමුත් අමාත්‍යාංශය විසින් වැය විෂයය 03 ක් සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 236.3 ක මුදල ඉක්මවා එකතුව රු.මිලියන 20.62 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි.	භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව හඳුනාගත් සියලු බැරකම් 2024 ජනවාරි 31 දින වන විට බැරකම් වශයෙන් වාර්තාකර ඇත. එම බැරකම් ගිණුම් වාර්තාවල පෙන්නුම් කර ඇත.	ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් හා බැරකම් ඇතිකර නොගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ 2024 වාර්ෂික ගිණුම් ප්‍රකාශනය අනුව වැය විෂයයන් 2 යටතේ අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. මිලියන	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය සංස්ථාව හරහා ඉටු කරන ලද ව්‍යාපෘති සඳහා 2024 දෙසැම්බර් 31 වන දිනට අදාලව කිසිම බැරකමක් සඳහා බැඳීම් ඇතිකරගෙන	වර්ෂය තුළ ඇති කරගත් සියළු බැඳීම් හා බැරකම් පිලිබඳ විස්තර වාර්ෂික ගිණුම් ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතුය.

	1,212.21 ක ශේෂය අමාත්‍යංශයේ බැදීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.	නොතිබුණි.	
(ඈ)	අමාත්‍යංශය විසින් වැය විෂයන් 09 ක් යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ඇතිකරගෙන තිබුණු එකතුව රු. මිලියන 312.03 ක් වටිනා බැරකම් පිළිබඳ විස්තර බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත්කර නොතිබුණි.	භාණ්ඩාගාරය විසින් අවසාන ගිණුම් වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2024 හි උපදෙස් අනුව 2025 ජනවාරි 31 දිනට වාර්තාවන සියලු බැරකම් වාර්තා කර ඇත.	වර්ෂය තුළ ඇති කරගත් සියළු බැදීම් හා බැරකම් පිළිබද විස්තර වාර්ෂික ගිණුම් ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් 2024 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රකාශනය අනුව, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යංශ වැය ශීර්ෂයට අදාළ මුළු බැදීම් හා බැරකම් ශේෂය රු.මිලියන 1,044.59 ක් වුවද අමාත්‍යංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ ශේෂවල එකතුව රු.මිලියන1,094.57 ක් විය. රු.මිලියන 49.98 ක වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.	භාණ්ඩාගාරය විසින් 2024 වර්ෂය සඳහා නිකුත් කරන ලද බැදීම් හා බැරකම් වාර්තාව ගිණුම් වාර්තාවල දක්වා ඇති අතර, වෙනත් බැදීම් හා බැරකම් වටිනාකමක් ගිණුම් වාර්තාවල පෙන්වා නැත.	නිවැරදි බැදීම් හා බැරකම් ශේෂ මූල්‍ය වාර්තාවලට ඇතුළත් කළ යුතුය.

3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික වියයුතුය. එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින්කල සමාලෝචනය කර, පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. නමුත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	අමාත්‍යාංශයේ ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් සඳහා අමාත්‍යාංශයේ මූල්‍ය කටයුතු මෙහෙයවීම සඳහා මුදල් රෙගුලාසි 135,136 හා 137 යටතේ නිලධාරීන් අතර බලය පවරා ඒ කටයුතු සිදුවීම පිළිබඳව දිගින් දිගටම අධීක්ෂණය සිදුකරයි. එම බලතල පැවරීම පිළිබඳ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර ඇති අතර වාර්ෂිකව නියමිත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා පවත්නා අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනාගෙන, ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග අධීක්ෂණය කරමින් ඒවා නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධානවලට අනුකූලව අවශ්‍ය සමාලෝචනයන් සිදුකර විගණකාධිපති වෙත වාර්තා කළ යුතුය.
(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත් වාර්තාවේ 4.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි.	අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා බොහොමයක් කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හරහා සිදුකෙරේ. එම ව්‍යාපෘති හා ආයතන සම්බන්ධ විගණන විමසුම්වලට අදාල මූලික තොරතුරු එම ආයතන වලින් ලබාගෙන, අධ්‍යයනය කර, පිළිතුරු සකස් කිරීම සඳහා යම් කාලයක් ගතවන බව අමාත්‍යාංශය විසින්ද හඳුනාගෙන ඇත. එම තත්ත්වය අවම කර ගැනිමට මේ වන විටත් කටයුතු කරනු ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යංශය සතු අංක KL – 9507 දරන වාහනය අලුත්වැඩියාව සඳහා, වාහනයේ නියෝජිත ආයතනය වෙත 2021 වර්ෂයේ දී යොමුකර තිබුණු අතර අලුත්වැඩියා කටයුතු අවසන්කර එම ආයතනය විසින් 2023 සැප්තැම්බර් 27 දින ඉන්වොයිසියක් නිකුත් කර තිබුණු නමුත් අදාළ වියදම 2023 වර්ෂයේ සිදුකර නොතිබුණු අතර 2024 මාර්තු 13 දින එම ආයතනය විසින් නැවත ඉදිරිපත් කළ ඉන්වොයිසිය සඳහා අමාත්‍යංශය විසින් ගෙවීම් කර තිබුණි. 2021 වර්ෂය තුළදී ඇතිකර ගන්නා ලද බැඳීමක් හා 2023 වර්ෂයේ දී සිදු කරන ලද අලුත්වැඩියාවක් වෙනුවෙන් මුදල් රෙගුලාසි අංක 115 ප්‍රකාරව අනුමැතියකින් තොරව 2024 ජූනි 24 දින රු.මිලියන 2.5 ක මුදලක් ගෙවා තිබුණි.	මෙම කාර්යය ඉටු කිරීමට 2021 වර්ෂයේ අනුමැතිය ලැබී තිබුණද කාර්යය අවසන් කර 2024 වර්ෂයට අදාලව ඉන්වොයිස් පත්‍රයක් නැවත නිකුත් කර තිබීම නිසා එම ඉන්වොයිස්පත්‍රයට ගෙවීම සඳහා මුදල් රෙගුලාසි 115 යටතේ අනුමැතියක් ලබාගැනීම අවශ්‍ය නොවේ.	2021 වර්ෂය තුළ දී ඇතිකරගන්නා ලද බැඳීමක් හා 2023 වර්ෂයේ දී සිදු කරන ලද අලුත්වැඩියාවක් වෙනුවෙන් 2024 වර්ෂයේදී ගෙවීමේදී මුදල් රෙගුලාසි 115 ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	අනුරාධපුර මහවිලච්චිය පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතිය යටතේ, නිවාස හා අනෙකුත් ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ එකතුව රු.මිලියන 4.70 ක විචලනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	එම ව්‍යාපෘතියේ රු.මිලියන 4.70 ක විචලතාවයක් හඳුනාගෙන නැත. විෂය පථයෙහි වෙනස්වීම මත විචලතාවයක් වශයෙන් හඳුනාගෙන ඇත්තේ IPC 11 ගෙවීම් කරන අවස්ථාව වන විට රු.මිලියන 3 කි. එම විචල්‍යතාවය මුළු පිරිවැයෙන්	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව, ස්ථාවර තාක්ෂණික කමිටුවේ (STC) පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර ඉහත කී විෂය පථය වෙනස්කිරීම සඳහා ද නිසි අනුමැතියක් ලබාගත යුතුය.

	සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව, ස්ථාවර තාක්ෂණික කමිටුවේ (STC) පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ඉහත කී විෂය පථය වෙනස්කිරීම සඳහා ද නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	සියයට 10 ට වඩා අඩුවේ. මිල විචලතාවයන් අනුමත කිරීමට ප්‍රථම ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුවේ (STC) පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත.	
(ඇ)	කොළඹ නගරයේ ඇළවේලි,වැව් හා පොකුණු නඩත්තු කිරීම,ගංවතුර අවම කිරීම හා තෙත්බිම් කළමනාකරණ ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2023 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත සිදු කරනු ලැබූ කාරයයන් සඳහා අමාත්‍යාංශය මගින් අනුමත කරනු ලැබූ නව රේටයන් හා ඒ මත සියයට 17 ක පොදුකාර්යය පිරිවැයද සමග ඉදිරිපත් කළ බිල්පත් සඳහා මහාභාණ්ඩාගාරය විසින් රු.මිලියන 2,924.29 ක් ලබාදී තිබුණි. මෙම ආදායමින් සියයට 75 ක එනම් රු.මිලියන 2,211 කට අදාල කාරයයන් 25 ක පිරිවැය රු.මිලියන 831 ක් වූයෙන් මෙම කාර්යයන් සඳහා නව රේටවලට අනුව සැකසූ බිල්පත් නිසා පිරිවැයට සියයට 166 ක එනම් රු.මිලියන 1,380 කට අධික ලාභයක් උපයා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් අනුමත කරල ලද නව රේටයන් තාත්වික නොවන බව නිරීක්ෂණය විය.	2019 අගෝස්තු 21 දිනැති අංක අමප/19/2133/116/078 දරන කැබිනට් අනුමැතිය අනුව අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරනු ලබන මූලික රේටයන්ට (Basic Rate) අමතරව සියයට 17ක ගාස්තුවක් (Overhead) අනුමත කර ඇත. ඒ අනුව භාණ්ඩාගාර අරමුදල් මත ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව 2023 වර්ෂයේ කරන ලද ව්‍යාපෘති සඳහා හිමි මුදල් බැවින් එම ආයතනය අධිලාභ ලබාගැනිමක් සිදුවී නොමැත.	සංස්ථාව විසින් සිදුකරනු ලබන වැඩ සඳහා උචිත රේටයන් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය.

3.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂාවකදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගණුදෙණුවක් පිලිබඳ විස්තර පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 ඔක්තෝබර් 21 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව සඳහා ජේෂ්ඨ සහකාර ලේකම් (පාලන) තනතුරෙහි පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා පත්කල සහකාර ලේකම්වරයා, වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වැඩබැලීම සඳහාද පත්කර තිබුණු අතර 2022 ජනවාරි සිට 2023 සැප්තැම්බර් කාලසීමාව සඳහා ඔහුට අනුයුක්ක කර තිබුණු ඩබල් කැබ් රථයේ ඉන්ධන වියදම් ලෙස රු.මිලියන 0.9 ක් ඉල්ලා තිබුණි. නමුත් මෙම නිළධාරියා විසින් නිල වාහනයක් භාවිතා කිරීම සඳහා කරන ලද ඉල්ලීමක් හෝ පෞද්ගලික මුදලින් ඉන්ධන සපයා ගැනීමට සහ ප්‍රතිපූරණය කරගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලබාදුන් අනුමැතියක් හෝ අදාල කාලය තුළ ඩබල් කැබ් රථයට තම පෞද්ගලික මුදලින් ඉන්ධන සඳහා වැයකල බවට කිසිදු තහවුරුවක් හෝ නොමැතිව අමාත්‍යාංශය විසින් 2023 ඔක්තෝම්බර් 20 දින රු.මිලියන 0.9 ක් ගෙවා තිබුණි. තව ද වර්තමානයේ නාගරික සංවර්ධන,ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ ජේෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවාහන හා නඩත්තු) ලෙස රාජකාරි කටයුතු කරන මෙම නිලධාරීයා 2023 ජනවාරි 23 දින සිට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ	ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය 29 වන වගන්තිය අනුව 2025 මැයි 20 දිනැතිව අතිරේක ලේකම් (ආයතනික කටයුතු) පත් කර මූලික විමර්ෂණයක් පවත්වා වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇත. අදාල මූලික විමර්ශණ වාර්තාවේ නිර්දේශයන් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.	මූලික විමර්ශණ වාර්තාවේ නිර්දේශයන් හා විධිමත් පරීක්ෂණ මගින් ඉදිරි ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.

වැඩබලන සාමාන්‍යාධිකාරි ලෙසද පත්කර තිබුණු අතර අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදයට පටහැනිව 2023 ජනවාරි 27 දින සිට 2024 නොවැම්බර් 18 දින දක්වා කාල සීමාව තුල සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සංචිත වාහනද භාවිතා කර තිබුණි. ඒ සඳහා එම අධිකාරිය විසින් රු.මිලියන 2.63 ක මුදලක් ඉන්ධන සඳහා පමණක් වැයකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	2009 වර්ෂයේ යුද්ධය අවසන් වීමෙන් පසු උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ පවුල් සඳහා නිවාස/ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර එතැන් පටන් 2024 දෙසැම්බර් 31 දින දක්වා උතුරු නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 08 ක නිවාස 36736 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 29,813 ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(අ)	සමාලෝචිත වර්ෂය තුළ වැඩ ආරම්භ කරන ලද නිවාස 207 ක සහ සමාලෝචිත වර්ෂයට පෙර වැඩ ආරම්භ කරන ලද වහල මට්ටම දක්වා වැඩ නිම කළ නිවාස 102 ක, බිත්ති මට්ටම දක්වා වැඩ නිම කළ නිවාස 12 ක හා අත්තිවාරම පමණක් යෙදූ එක් නිවසක වැඩ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිමකර නොතිබුණි.	නිවාසවල ඒකක පිරිවැය ඉහළ යාම නිසා ප්‍රතිලාභීන්ට ලබා දෙන ප්‍රදානය ඉහළ නැංවීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. වැඩ සම්පූර්ණ කර අවසන් කර නොමැති නිවාස වල ඉදිකිරීම් කටයුතු මෙම වර්ෂය තුළ අවසන් කරන ලෙසටත්, ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ	නියමිත කාලවකවානුව තුළ ඉදිකිරීම් කටයුතු නිම නොකළ නිවාස සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.

		එළඹුණු ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු නොකරන ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කරන ලෙසටත් උපදෙස් ලබා දී ඇත.	
(ආ)	සමාලෝචිත වර්ෂය අවසාන වනවිට යුද්ධය නිම වී වසර 15 ක් ගත වී තිබුණ ද, යුද්ධයෙන් අවතැන්වූවන් තවදුරටත් හඳුනාගනිමින් පවතින අතර නැවත පදිංචි කිරීමේ කටයුතු ද නිම වී නොතිබුණි.	මේ වන විට සියළු සුබසාධන මධ්‍යස්ථාන වසා දමා නැවත පදිංචි කිරීමේ කටයුතු අවසන් කර ඇත. නමුත් අවතැන් වූ පවුල් මේ වන විටත් තාවකාලික නිවාස වල රැඳී සිටින බැවින් ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරා දිය යුතුව ඇත. මේ වන විටත් උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් නිදහස් කරමින් පවතී. 2024 වර්ෂයේ දී යාපනය දිස්ත්‍රික්කයේ අක්කර 234.83 ක් නිදහස් කර ඇත.	අවතැන්වූවන් හඳුනා ගැනීමේ ක්‍රමවේදය සමාලෝචනය කර එම කටයුතු අවසන් කර නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් බලපෑමට පත් වූ පවුල් සඳහා කොන්ක්‍රීට් පැනල් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020 පෙබරවාරි 20 දින ආරම්භ කර 2020 අගෝස්තු 12 දින නිම කළයුතු වුවද 2022 නොවැම්බර් 30 දින දක්වා අවස්ථා 04 කදී කාලය දිර්ඝ කිරීම් ලබාදී තිබුණද මෙම ව්‍යාපෘතිය නිසියාකාරව ඉටු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් 2023 පෙබරවාරි 15 දින කොන්ත්‍රාත් ගිවිසුම		

	අවසන්කර රු.මිලියන 19.2 ක් වූ කාර්යසාධන සුරක්ෂණය මුදල් කරගෙන පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(අ)	කොන්ත්‍රාත් ගිවිසුමේ 15.2 (C) වගන්තිය ප්‍රකාරව කාර්ය සාධනය දුර්වල වීම මත මුදල් කරනු ලැබූ මෙම මුදලින්, දෝෂ නිවැරිදි කිරීමෙන් පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැරකල යුතුව තිබුණු අතර 15.4 වගන්තිය ප්‍රකාරව, අඩුපාඩු සම්පූර්ණ කිරීම, වැඩ නිමකිරීමේ ප්‍රමාදය මත සිදු වූ පාඩුව සහ දරන ලද අනෙකුත් වියදම් පියවා ගැනීමට අවශ්‍ය මුදල් රඳවා ගත යුතුව තිබුණි. නමුත් ඊට පටහැනිව 2024 මැයි 31 දින එම මුදලින් රු.මිලියන 9.18 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ආපසු ගෙවා තිබුණි.	කොන්ත්‍රාත් ගිවිසුමේ 15.4 වගන්තිය ප්‍රකාරව, කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීමෙන් පසු ව්‍යාපෘතියේ උපදේශක ආයතනය වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) විසින් 2024 මැයි 29 දින නිකුත් කරන ලද සහතිකය හා ව්‍යාපෘති කළමනාකරණය කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අංක 12 අනුව, කාර්යසාධන ඇපකරයෙන් අයකරගත යුතු මුදල අඩුකර ඉතිරි මුදල් කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවීමට කටයුතු කර ඇත.	කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතු අතර ගිවිසුමේ කොන්දේසිවලින් බැහැරවීම් සම්බන්ධව නොපමාව පියවර ගත යුතුය.
(ආ)	කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර වසර 02ක් ගත වී තිබුණද මුදල් රෙගුලාසි 705(ආ) ප්‍රකාරව කොන්ත්‍රාත් ආයතනය අසාධු ලේඛනගත කිරීමට අමාත්‍යාංශය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, එම ආයතනය අසාධු ලේඛනගත කිරීම සඳහා අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලදි. ඒ කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ අනුව මේ වන විට ඉදිරි කටයුතු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මිනුවන්ගොඩ වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 180.64 ක කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකු වෙත පවරා අදියර 3 කින් 2018-2024 කාලසීමාව තුළ ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	මහල් 3 කින් සමන්විත මෙම පොදු වෙළඳසංකීර්ණ ගොඩනැගිල්ල අදියර 3 ක් යටතේ සිදුකිරීමට කටයුතු කිරීම විගණනයේ දී මතභේදාත්මක විය.	පළමු අදියරේදී මුළු ගොඩනැගිල්ලේ අපර ව්‍යුහය හා පළමු මහලේ ස්ලැබ් මට්ටම දක්වා කොටසද දෙවන අදියරේදී ඉතිරි මහල් දෙකෙහි ඉදිකිරීම් කටයුතුද තුන්වන අදියරදී විදුලි සෝපානය හා අනෙකුත් සියලු සුළු ඉදිකිරීම් කටයුතුද නිමකර සම්පූර්ණ ව්‍යාපෘතියම නගර සභාව වෙත භාරදීමට කටයුතු කර ඇත.	මූලික සැලසුම් හා ශක්‍යතා අධ්‍යන වාර්තා අනුව කටයුතු කළ යුතුය.
(ii)	රු.මිලියන 88.96 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත මෙහි පළමු අදියර 2019 දෙසැම්බර් 28 දින නිම කල යුතු වුවද දින 556 ක කාල ප්‍රමාදයකින් පසුව වැඩ අවසන් කිරීම නිසා ප්‍රමාද දඩ වශයෙන් රු.මිලියන 8.89 ක් අයකර ගෙන තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු විසින් ඊට එරෙහිව ආරවුල් බේරුම්කරණ මණ්ඩලයට (DAB) කල පැමිණිල්ලට ලද තීරණය අනුව, දෙපාර්ශවයේ එකඟතාව මත රු.මිලියන 12.86 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුව තිබුණි.	මේ සම්බන්ධ සියලු සාධාරණීකරණයන් අමාත්‍යාංශය විසින් ලබා දුන්නත්, කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ආරවුල් බේරුම්කරණ මණ්ඩලය විසින් අදාල තිරණය ලබා දී ඇත.	කොන්ත්‍රාත් සම්බන්ධ නඩු හා බේරුම්කරණ කටයුතු සම්බන්ධයෙන් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක විය යුතු අතර ඊට අනුකූල නොවීමෙන් අමාත්‍යාංශයට සිදුවන පාඩු හා අලාභවලට අදාළ නිලධාරීන්ට එරෙහිව නොපමාව පියවර ගත යුතුය.

	ව්‍යාපෘතියේ උපදේශක ආයතනය විසින් අනුමත කරන ලද දින දීර්ඝකිරීම් සඳහා අමාත්‍යංශය විසින් අනුමැතිය ලබා නොදීම සාධාරණීකරනය කිරීමට හේතු ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඉහත මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීමට අමාත්‍යංශයට සිදුව තිබුණි. නමුත් ඊට වගකිවයුතු නිළධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යංශය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.		
(iii)	රු.මිලියන 17.96 ක වටිනාකමකට ගිවිසුම්ගත වූ ව්‍යාපෘතියේ දෙවන අදියර, 2021 දෙසැම්බර් 19 දින අවසන් කර තිබුණු අතර කඩකාමරවලට අකුලන දොරවල් යෙදීම, ජල පහසුකම ලබා ගැනීම, විදුලි පහසුකම ලබා ගැනීම, කාණු පද්ධතිය හා ගොඩනැගිල්ල ආශ්‍රිත භූමිය සංවර්ධනය කිරීම ආදිය සම්පූර්ණ කිරීමෙන් තොරව 2022 අප්‍රේල් 01 දින මීනුවන්ගොඩ නගර සභාව වෙත භාර දී තිබුණි.	එවකට රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් අදාල අනුමැතීන් ලබාගැනීමෙන් පසු අකුලන දොරවල් ඇතුළු අනෙකුත් මූලික අවශ්‍යතා කිහිපයක් මීනුවන්ගොඩ නගර සභා අරමුදලින් නිම කරගෙන ඇත.	ගිවිසුමට අනුකූලව කටයුතු කළ යුතුය.
(iv)	ව්‍යාපෘතියේ අදියර 3 යටතේ ගොඩනැගිල්ල සඳහා විදුලි සෝපානයක් සවිකිරීම හා අබාධිත වැසිකිලිය ඉදිකිරීම සඳහා රු. මිලියන 17.96 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණු අතර කොන්ත්‍රාත්තුව 2024 ජූලි 6 දින අවසන් කළ යුතු වුවද දින 86 ක ප්‍රමාදයකින් පසුව 2024 සැප්තැම්බර් 30 දින අවසන් කර තිබූ නමුත්, ප්‍රමාද කාලය සඳහා දින දීර්ඝ කිරීම ආයතන ප්‍රධානියා විසින් අනුමත කර නොතිබුණු බැවින් ගිවිසුමේ කොන්දේසි අංක 49.1 ප්‍රකාරව ප්‍රමාද දඩ ලෙස රු.මිලයන 0.9 ක් කොන්ත්‍රාත්කරුගෙන් අඩුකිරීමට කටයුතු කර නොතිබුණි. තවද රු.මිලියන 9.61 (වැට් රහිත) ක් වැයකර 2024 සැප්තැම්බර් 30 දින	මීනුවන්ගොඩ වෙළඳ සංකීර්ණය - අදියර 3හි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා 2024 ජූලි 06 දින දක්වා කාලය ලබා දී තිබුණි. එසේවෙතත්, කොන්ත්‍රාත් ආයතනයට ව්‍යාපෘතිය එම දිනට අවසන් කිරීමට නොහැකි වීම මත කරන ලද ඉල්ලීම් හා උපදේශක ආයතනයේ නිර්දේශ මත කොන්ත්‍රාත්තුවේ නිම කිරීමේ කාලය 2024 සැප්තැම්බර් 30 දින දක්වා අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන) විසින් දීර්ඝ කර ඇත. කොන්ත්‍රාත් ආයතනය විසින් එහි වැඩ 2024 සැප්තැම්බර් 25 දින වන විට අවසන් කර භාර දී ඇති බැවින් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද දඩ මුදල්	දින දීර්ඝ කිරීම සඳහා අමාත්‍යංශ ලේකම්ගෙ අනුමැතිය ලැබී නොමැති බැවින් අදාළ දඩ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය.

	වැඩ අවසන් කරන ලද විදුලි සෝපානය 2024 දෙසැම්බර් 31 දක්වාම නිශ්කාර්යව පැවතුණි.	අය කිරීමේ හැකියාවක් නැත.	
(v)	ප්‍රදේශයේ මහජනතාවගේ අවශ්‍යතාවන් ඉටුවන ආකාරයෙන් සැලසුම් සකස් කිරීමකින් තොරව, මීනුවන්ගොඩ වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමට කටයුතු කර තිබුණු බැවින් රු.මිලියන 180 ක් පමණ වැයකර ඉදිකරන ලද මෙම වෙළඳ සංකීර්ණය වෙත වැයකළ මුදලට සරිලන උපරිම ඵලදායිතාවක් ලබාගත නොහැකි වී තිබුණු බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	නාගරික සංවර්ධන අධිකාරිය විසින් මීනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලසුම් මඟින් හඳුනාගත් මෙම ව්‍යාපෘතිය මඟින් වෙළඳකුටි 90 ක් ඉදිකර ඇති අතර, නගරය තුල පැවති වටිනා ඉඩකඩක් තුල උපරිම ඵලදායීතාවය ලබාගත හැකි පරිදි සහ පවතින ඉල්ලුම සපුරාලිය හැකි පරිදි ගොඩනැගිලි සැලසුම සකස් කර නිම කිරීමෙන් අනතුරුව නගර සභාව වෙත භාරදීම සිදුකර ඇත. තවද මේ වන විට වෙළඳ සංකීර්ණය සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරී තත්වයෙන් පවත්වාගෙන යනු ඇත.	මහජන බදු මුදලින් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සීතාවකපුර නගර සභාව සඳහා රු.මිලියන 113.11 ක වියදමකින් පොදු වෙළඳ ගොඩනැගිල්ලක් ඉදිකර 2024 අප්‍රේල් 10 දින එම නගර සභාව වෙත භාරදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	2022 වර්ෂයේ දී අදාළ විෂයපථය සීමා කිරීම නිසා කඩකාමරවල ප්‍රමාණය කුඩා වීමත්, කඩකාමර නියමිත පරිදි වෙළඳාම් කටයුතු පහසුවෙන් කරගත හැකි ලෙසට ස්ථාපිත නොකිරීමත් හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාව වෙත භාරදී මාස 07ක් ගතවී තිබුණ ද කඩහිමියන් විසින් කඩ කුලියට ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට මෙතෙක් නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.	සීතාවක නගර සභාවේ ඉල්ලීම පරිදිම කඩකාමර ඉදිකර ඇති අතර, එම කඩකාමර කුඩා වීමක් සිදුවී නැත.	වර්ෂ 2 කටය වැඩි කාලයක සිට මෙම කඩකාමර ඵලදායී ලෙස ප්‍රයෝජනයට නොගැනීම සම්බන්ධයෙන් පරීක්ෂා කර එම කඩ කාමර ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.

(ii)	රු. මිලියන 102 ක් වූ සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා අවස්ථා 4 ක දී විචලන නියෝග අනුමත කර තිබුණු අතර තවත් රු.මිලියන 23.62 ක් ගෙවිය යුතුව තිබුණි. එය ඉහත දක්වා ඇති ඇස්තමේන්තු වටිනාකමට වඩා රු.මිලියන 34.74 ක එනම් සියයට 34 ක විචලනයකි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ඡේදය අනුව විචලනයන්ගේ සාමාන්‍ය ප්‍රමාණය හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්මවන්නේ නම් ප්‍රධාන ගිණුම් නිළධාරියාගෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් ඒඅනුව කටයුතු කර නොතිබුණි. තවද විෂයපථය සීමා කිරීම මත සංශෝධිත ඇස්තමේන්තුවක් හා සැලැස්මක් අනුමත කර ගෙන නොතිබුණි.	ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය අංග නිම කිරීම සඳහා වෙන් කරන ලද දළ ඇස්තමේන්තුව රු.මිලියන 102 ක් ලෙස මුදල්, ආර්ථික, ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් නිර්දේශ කර තිබුණු අතර ඒ තුල සංශෝධිත විචල්‍යතා (Price Escalation) සහ බදු (Tax) ඇතුලත් නොවුනි. නමුදු ව්‍යාපෘතිය සඳහා මුළු විචලතාද ඇතුලුව සකස් කරන ලද දළ ඇස්තමේන්තුව රු. මිලියන 167.6 ක් විය. තවද 2023 හා 2024 වර්ෂයන් සඳහා යෝජිත ක්‍රියාකාරී සැලස්මෙහි ඇස්තමේන්තු මුදල ලෙස මිලියන 167.6 ක් සඳහන්ව ඇත. මෙම ව්‍යාපාතියේ අවසන් බිල්පත අනුව විචල්‍යයන්ගේ සාමාන්‍ය ප්‍රමාණය හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන (Contingencies) සියයට 10 නොඉක්මවන බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අදාල අනුමැතිය ලබාගෙන ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 අනුව හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්මවන්නේ නම් ප්‍රධාන ගිණුම් නිළධාරියාගෙන් අනුමැතිය ලබා ගත යුතුය.
(ඇ)	අමාත්‍යාංශය විසින් රු.මිලියන 400 ක් වැයකර ඉදිකරන ලද මහර පරිපාලන හා වාණිජ සංකීර්ණ ගොඩනැගිල්ල අදාළ පාර්ශවයනට භාරදීමට කටයුතු නොකිරීම නිසා 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා වසර 6 ක් නිෂ්කාර්යව පැවතුණි. අමාත්‍යාංශය විසින් මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල මහර ප්‍රාදේශීය සභාව වෙත භාර ගැනීම සඳහා 2025 පෙබරවාරි 21 දිනැති ලිපිය මඟින් එකඟතාවය පලකර ඇත. එමෙන්ම එම ලිපිය මඟින් මහර ප්‍රාදේශීය සභාව විසින් කර ඇති යෝජනා අධ්‍යයනය කර එකඟතා ගිවිසුම සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ නීති අංශය විසින් කටයුතු කරගෙන යනු ඇත.	ඉදිකරන ලද ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගැනීමට හේතු වූ කරුණු හඳුනාගෙන අවශ්‍ය නිවැරදිකිරීම් සිදු කිරීමට හා ගොඩනැගිල්ලෙන් උපරිම ඵලදායීතාවයක් ලබා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

(ඇ)	කොටගල තෙත්බිම් උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් රු.මිලියන 75.66 ක වැඩ අවසන් වටිනාකමක් මත ඉදිකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	තෙත්බිමක් ලෙස සංවර්ධනය කිරීම පිණිස පවරාගෙන නාගරික සංවර්ධන අධිකාරිය වෙත භුක්තිය භාර දී තිබුණු හෙක්ටයාර් 12 ක ඉඩමෙන්, තෙත්බිම් උද්‍යානය ඉදිකිරීම සඳහා හෙක්ටයාර් 05 ක පමණ කොටසක් යොදාගෙන තිබුණු අතර අවශ්‍යතාව නියමිත පරිදි හඳුනාගැනීමකින් තොරව ඉඩම් අත්පත්කර ගැනීම හේතුවෙන් ඉතිරි හෙක්ටයාර් 07 වසර 04 ක පමණ කාලයක් තිස්සේ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.	මේ වන විට ඉතිරි හෙක්ටයාර ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් වෙත ආපසු භුක්තිය භාරදීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඉතිරි හෙක්ටයාර ප්‍රමාණයේ භුක්තිය භාරදීමේ කටයුතු කඩිනම් කළ යුතුය.
(ii)	ඉහත අත්පත් කර ගත් ඉඩම් හිමිකරුවන්ට වන්දි ගෙවීම් කටයුතු 2024 දෙසැම්බර් 31 දින වනවිටද සිදුකර නොතිබුණු අතර සංවර්ධන කටයුතු සිදු නොකළ ඉතිරි භූමි ප්‍රමාණය ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 39 (අ)1 අතුරු විධානය පරිදි පැරණි ඉඩම් හිමිකරුවන්ට අවසතු කිරීමටද කටයුතු කර නොතිබුණි.	තෙත්බිම් උද්‍යානය සංවර්ධනය කිරීමට අදාල ඉඩම් ප්‍රමාණය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව අත්කර ගැනීමේ ඉදිරි කටයුතු සිදුකර ඉතිරි ඉඩම් ප්‍රමාණය අවසතු කිරීමෙන් පසු හෙක්ටයාර 5 ක ප්‍රමාණය සඳහා වන්දි ගෙවීමට කටයුතු කරනු ඇත.	අත්පත් කර ගත් ඉඩම් හිමිකරුවන්ට වන්දි ගෙවීම් කටයුතු හා ඉතිරි ඉඩම් අවසතු කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය.
(iii)	වර්ගමීටර් 15,572.19 ක වපසරියක් සහිත පොකුණ සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 7.01 ක් හා ඇවිදීමේ මංතීරුව සකස් කිරීම සඳහා රු.මිලියන 25.86 ක් වැයකර තිබුණද ඒවායේ කිසිදු නඩත්තු කටයුත්තක් සිදු නොකර අතහැර දමා තිබීමෙන් අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට නොහැකිවී තිබුණු අතර දරන ලද මුළු වියදම වන රු.මිලියන 32.87 මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.	විධිමත් අවබෝධතා ගිවිසුමකට එළඹෙන තෙක් ජලාශ කොටස හැර ඉතිරි සංවර්ධනය කරන ලද කොටස්වල නඩත්තු කටයුතු වසරක කාලයකට කොටගල ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි. එබැවින් උද්‍යානය නිසිලෙස කළමනාකරණය කිරීම කොටගල ප්‍රාදේශීය සභාව සතු වගකීමකි. එම කාල සීමාව අවසන්ව ඇති බැවින් නැවතත් එම කාල සීමාව දික්කර උද්‍යානය ක්‍රමවත්ම	ව්‍යාපෘතිය නිසි පරිදි නිම කිරීම හා නඩත්තු කිරීම තුලින් මෙම ව්‍යාපෘතියේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

		නඩත්තුව සඳහා කොටගල ප්‍රාදේශීය සභාව විසින් එකඟතාවය ප්‍රකාශ කර ඇත.	
(iv)	රු.මිලියන 6.38 ක් වැය කර 24w LED වීදි පහන් කණු 40 ක් සහ මීටර් මැදිරියක් (Meter room) ස්ථාපිත කර තිබුණද එම පරිශ්‍රය වෙත විදුලි පහසුකම ලබාගෙන නොතිබුණු අතර ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිදු වැඩපිළිවෙලක්ද යොදා නොතිබුණි. එබැවින් විදුලි පහන් සහ ස්විච් සියල්ලම කිසියම් පිරිසක් විසින් ගලවාගෙන ගොස් තිබුණු බව භෞතික විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.	උද්‍යානය නිසිලෙස කළමනාකරණය කිරීම කොටගල ප්‍රාදේශීය සභාව සතු වගකීමක් වනු ඇත.	ව්‍යාපෘතිය නිසි පරිදි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නිම කිරීම සඳහා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාළ වගකීම් ඉටු නොකිරීම සම්බන්ධයෙක් නොපමාව පරීක්ෂා කර පියවර ගත යුතු අතර ව්‍යාපෘති භූමියේ ආරක්ෂාව තහවුරු කිරීමට ස්ථිර වැඩපිළිවෙලක් සැකසිය යුතුය.
(ඉ)	රු.මිලියන 65.77 ක් වැයකර ඉදිකරන ලද බෙලිඅත්ත අම්පිටිය වැව ඇවිදින මංතීරුව හා භූ දර්ශන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, නඩත්තු කටයුතු සිදුනොකිරීම නිසා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පවතින බව නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර, අවස්ථා කිහිපයකදී බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත භාර ගන්නා ලෙස දැනුවත් කලද විවිධ අඩුපාඩු පෙන්වා දෙමින් ව්‍යාපෘතිය භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත.	ව්‍යාපෘති කළමනාකරණ කටයුතු කාර්යක්ෂම හා ඵලාදායීවීම තුළින් ගැටළු අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතියට අදාළව ග්‍රාමීය ජල පහසුකම් සැපයීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2021 දෙසැම්බර් 27 දින රු.මිලියන 56.2 ක මුදලක් ලබාදී තිබුණද ව්‍යාපෘතියේ සිවිල් කටයුතු ඊට මාස 08 කට පසුව ආරම්භ කර තිබුණු බැවින් ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03 ක් ඉක්මවා තිබුණ ද ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම නිවැරදි ප්‍රමාණ මිණුම් ලබා නොගෙන ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් ඇස්තමේන්තුවට සිදුකරන ලද සංශෝධනයක් ලෙස 2021 දෙසැම්බර් 31 දින රු.මිලියන 5.51 ක් ජාතික ජල සම්පාදන හා	2025 මැයි 25 දින වන විට මෙම ව්‍යාපෘතියේ සියළු ඉදිකිරීම් කටයුතු අවසන් වීමට අපේක්ෂිත බව ව්‍යාපෘතියේ උපදේශක ආයතනය වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව දන්වා ඇති අතර මේ වන විට වැඩ අවසන් කර ඇත. ඇස්තමේන්තුවල මිළ වෙනස්වීම, ව්‍යාපෘතියේ සැලසුම් වෙනස් කිරීම **(Scope change)** සහ රටේ පැවති අභ්‍යන්තර තත්ව හේතුවෙන් ඇස්තමේන්තු සංශෝධනක් කිරීමට සිදුවිය. ව්‍යාපෘතිය අවසන් කර කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීම සඳහා වසර 03කට වැඩි කාලයක් ජල සම්පාදන මණ්ඩලයේ ගිණුම තුල එම මුදල් රඳවා ගැනීමට සිදුවී ඇත.	ව්‍යාපෘති කටයුතු කාලීනව හා ඵලදායීව නිම කර එහි ප්‍රතිලාභ ලබා ගැනීමට නොපමාව කටයුතු කළ යුතු අතර නිවැරදි ප්‍රමාණ මිනුම් ලබාගෙන ඇස්තමේන්තු සැකසීමට හා වෙන්කරන ලද ප්‍රතිපාදනයන් අපේක්ෂිත වැඩ කටයුතු ඉටුකර ගැනීමෙන් පසු අදාළ ආයතනයට මුදල් ගෙවීමටද කටයුතු කළ යුතුය.

	ජලාපවහන මණ්ඩලය වෙත නැවත ගෙවීමට සිදුවී තිබුණි. අපේක්ෂිත කාර්යය ඉටුකර ගැනීමට පෙර වසර 03 කට වැඩි කාලයක් වෙනත් ආයතනයකට මුදල් ගෙවා තිබීමද විගණනයේදී නිරීක්ෂණය කෙරේ.		
(එ)	තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 917 ක් වූ පිටිපන තලගල (අදියර 1) මාර්ගය හා බටහිර අන්තර් හුවමාරු මාර්ගය සංවර්ධන ව්‍යාපෘති සඳහා 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් රු.මිලියන 1,369.21 ක් වැයකර තිබුණි. ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටලුවක් හේතුවෙන් මෙම මාර්ගයන්හි වැඩ අවසන් කිරීමට නොහැකිව ව්‍යාපෘති අවසන් කර තිබුණි. ඒ හේතුවෙන් මාර්ගය ඉදිකිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට අමාත්‍යාංශයට නොහැකිවී තිබූ අතර මෙම ව්‍යාපෘති සඳහා දරන ලද වියදමද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.	මෙහි එක් කොටසක වන්දි පරීක්ෂණය සිදුකරමින් පවතින අතර ඉදිකිරීම් කටයුතු සඳහා 2026 වර්ෂයට අයවැය වෙන්කර ගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත. ඉතිරි කොටස ඉඩම්අත්පත් කරගැනීම් අවසන් කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරිම සඳහා 2027 වර්ෂයේ සැලසුම් කර ඇත. බටහිර අන්තර් හුවමාරු මාර්ගයේ ඉතිරි මීටර් 50 ක ප්‍රමාණය සම්බන්ධ කිරීම සඳහා අවහිරතාවයක් ලෙස පැවති ඉඩම් කට්ටි 2 සඳහා බිම් කට්ටි කොටස් 2 ක් ලබාදීමට සැලසුම් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇත.	මාර්ග ඉදිකිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයා වෙත ලබා දීමට නොපමාව කටයුතු කළ යුතුය.

4.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (LRT)		
(i)	සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (LRT) ආරම්භ කර වර්ෂ දෙකකට පසුව ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද 2020 සැප්තැම්බර් 21 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය පිරිවැය ඵලදායි නොවන	මෙය ප්‍රතිපත්තිමය තීරණයක් මත සිදුවූවක් බැවින් මෙම පිරිවැය දැරීමට සිදුවී ඇත.	ව්‍යාපෘතිය සැලසුම් අදියරේ සිට අත්හිටුවීම දක්වා වූ සියළු අදියරයන් නැවත අධීක්ෂණය කිරීම තුලින් ව්‍යාපෘතියේ අසාර්ථකත්වයට හේතු වූ කරුණු නොපමාව හඳුනා ගත යුතු අතර ඒ තුලින් ඉදිරි ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාවය හා

	ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත් බව දක්වා තිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය ඒකපාර්ශවීයව අවසන් කර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින දක්වා මෙම ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම රු.මිලියන 5,978 ක් වී තිබුණි. එසේම, මෙම ව්‍යාපෘතිය ඒකපාර්ශවීයව අවසන් කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශක සමාගමට සිදුවූ අලාභය ආවරණය කර ගැනීම සඳහා එම ආයතනය විසින් ගිවිසුමේ 2.9.5 දරන වගන්තිය ප්‍රකාරව රු.මිලියන 5,169 ක හිමිකම් මුදලක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබුණි. ඒ සම්බන්ධයෙන් පත්කල කමිටු වාර්තාවේ නිර්දේශ පරිදි එම උපදේශන ආයතනට 2024 දෙසැම්බර් 31 දින වන විට තවත් ඇ.ඩො.මිලියන 1.25 ක්, ජපන් යෙන් මිලියන 229.53 ක් සහ ශ්‍රී ලංකා රු.මිලියන 131.58 ක් ගෙවීමට සිදුව තිබුණු බැවින් මෙම සියළු වියදම් නිෂ්කාර්යය වියදම් බවට පත්වී තිබුණි.		ඵලදායීත්වය ඉහළ නංවා ගැනීමටද කටයුතු කළ යුතුය.
(ii)	ජපන් අන්තර් ජාතික සහයෝගිතා ආයතනයේ සමාන්‍ය ණය කොන්දේසි යටතේ ගිවිසුම්ගතව අත්සන් කර තිබුණු මෙම ණය ගිවිසුම ශ්‍රී ලංකා රජයේ ඒකපාර්ශවීය තීරණයක් අනුව අවසන් කර තිබුණද මෙතෙක් ණය ගිවිසුම නීත්‍යානුකූලව අහෝසි කර නොතිබුණු බැවින් එම ණය මුදල රජයේ වෙනත් සංවර්ධන කාර්යයක් සඳහා උපයෝජනය කිරීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන	මෙම ගිවිසුම මුදල් අමාත්‍යාංශය හා අදාල ජපන් ආයතනය අතර සිදුවී ඇති බැවින් ණය ගිවිසුම අහෝසි කිරීමේ වගකීමද විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා මුදල් අමාත්‍යාංශය විසින්ම සිදු කළ යුතු කාර්යයකි.	ණය කොන්දේසි අනුව රජයට ඇතිවිය හැකි මූල්‍ය අලාභය අවම කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.

	ඉදිරියේදී රජයට ඇතිවිය හැකි මූල්‍ය අලාභය අවම කරගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් 2024 දෙසැම්බර් 31 දක්වාම ගෙන නොතිබුණි.		
(iii)	ව්‍යාපෘතිය වෙනුවෙන් හෙක්ටයාර් 21 ක පමණ ඉඩම් අත්පත් කරගෙන තිබුණු අතර එම ඉඩම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වන විටද ගෙන නොතිබුණු බැවින් එම ඉඩම් නිෂ්කාර්යයව පැවතුණි.	2022 මැයි 02 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය අනුව මෙම අත්පත් කරගත් ඉඩම් අනාගත ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගැනීමට තීරණය කර ඇති බැවින් ඉඩම්හිමියන්ට නැවත ලබා දීමට කටයුතු කල නොහැක.	අත්පත් කරගෙන තිබුණු නිෂ්කාර්යයව පවතින ඉඩම් ඵලදායී කාර්යයක යෙදවීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.
(iv)	පාරිසරික,තාක්ෂණික,ආර්ථික හා මූල්‍යමය වශයෙන් ඵලදායී ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන තිබුණු මෙම ව්‍යාපෘතිය විධිමත් හා තාර්කික විශ්ලේෂණයකින් තොරව ඒකපාර්ශවීයව අවසන් කිරීම නිසා ශ්‍රී ලංකාවට සිදුවූ ආර්ථිකමය හා මූල්‍යමය නොවන අවාසිදායක තත්වයන් සම්බන්ධයෙන් වගකිවයුත්තන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයට සිදුවූ අලාභය අවමකර ගැනීමට අවශ්‍ය කිසිදු පියවරක් විගණිත දිනය දක්වාම ගෙන නොතිබුණි.	අමප/23/1244/601/041 හා 2023 ජූලි 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මේ පිලිබදව ක්‍රියා කළ යුතු වන්නේ ජනාධිපති ලේකම්තුමා වන බැවින් මෙම ව්‍යාපෘතිය පිළිබඳ ඉදිරි කටයුතු කිරීමට මෙම අමාත්‍යාංශයට බලයක් නොමැත.	ව්‍යාපෘතියේ අසාර්ථකත්වයට හා සිදුවී ඇති අලාභයට වගකිවයුත්තන් තීරණය කිරීම සඳහා විධිමත් පරීක්ෂණයක් පවත්වා එම අලාභ අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	හම්බන්තොට දිස්ත්‍රික්කය, නැගෙනහිර පළාත, බස්නාහිර පළාත හා කොළඹ නගරය වශයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2023 දෙසැම්බර් 14 දින ඇමෙරිකානු ඩොලර් මිලියන 0.41 කට සමාන රු. මිලියන 137.1 ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි.	අමාත්‍ය මණ්ඩල අනුමැතීන් මත සිංගප්පූරුවේ සබානා ජුරෝංග් ආයතනය සමඟ අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව එම ව්‍යාපෘති තුන ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ කටයුතු ආරම්භ කර ඇත. එම ව්‍යාපෘති තුනේ ප්‍රගතිය පදනම් කරගෙන අතුරු ගෙවීම් සිදුකර ඇත. හම්බන්තොට ප්‍රධාන	සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම නිසි ශක්‍යතා අධ්‍යයනයක් මත සිදු කළ යුතු අතර අමාත්‍යාංශය විසින් සිදු කරන ලද වියදම්වල ඵලදායීතාවය ඉහළ නංවාගැනීමට කටයුතු කළ යුතුය.

	බස්නාහිර පළාත හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙනුවෙන් 2018 වර්ෂයේ දීද එම ආයතනය විසින්ම සකස්කර තිබුණු සැලසුම්, වර්ෂ 05කට වැඩි කාලයක් භාවිතයට නොගෙන, නැවතත් ප්‍රධාන සැලසුම් සකස් කිරීමට එම ආයතනයම තෝරා ගැනීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් විය.	සැලැස්ම ක්‍රියාත්මක කිරිමේ ව්‍යාපෘතිය හැර ඉතිරි සැලසුම් දෙක පිළියෙල කිරීම අවසන් කර ඇත. හම්බන්තොට මහනගර සැලැස්ම සකස් කිරීමේ කටයුතුවලත් සියයට 50 ක් පමණ ගිවිසුම් ප්‍රකාරව අවසන් වී ඇත. මෙම සැලසුම් තුන පසුගිය රජය කාලයේ ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයන් මත ක්‍රියාවට නංවන ලද සැලසුම් වනු ඇත.	
(ඇ)	අඩක් නිමකර තිබුණු බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු, ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි iii ඡේදය අනුව, අන්‍යෝන්‍ය එකඟතාවය මත 2023 ජනවාරි 08 දින අවසන් කර තිබුණි. බිල්පත් පියවීමේදී සිදුකරනු ලබන ගැලපීම් පිලිබඳව හෝ රැඳවුම් මුදල් හා කාර්යසාධන බැඳුම්කර නිදහස් කිරීම සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයකට පැමිණීමකින් තොරව 2023 මාර්තු 17 දින රැඳවුම් මුදලින් රු.මිලියන 5.86 ක් කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. කාර්යසාධන සුරක්ෂණය ද 2023 දෙසැම්බර් 31 දින වන විට කල් පිරී තිබුණ ද එහි කාලය දීර්ඝ කිරීමට කටයුතුකර නොතිබුණි. කෙසේ වුවද පසුකාලීනව මෙම ව්‍යාපෘතිය සක්‍රීය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් 2024 දෙසැම්බර් 31 වන විටත් ගෙන නොතිබුණු බැවින් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් මෙතෙක් දරන ලද	මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) එකඟතාවය ලබා දී ඇත. නමුත් මෙය මිලියන 180 ක නව කොන්ත්‍රාත්තුවක් ලෙස ක්‍රියාත්මක කල යුතු වූ බැවින් කොන්ත්‍රාත් පිරිනැමීම තාවකාලිකව අත්හිටුවා ඇත. එබැවින් මෙය තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා බස්නාහිර පළාත් සභාවේ අරමුදල් වෙන්කරවා ගෙන ඉතිරි කොටස් නිම කිරීමට නියමිතව ඇත.	මෙම ව්‍යාපෘතිය සක්‍රීය කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

	රු.මිලියන 248.79 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.		
(ඈ)	රු.මිලියන 294.33 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත 2021 ඔක්තෝබර් 15 වැඩ ආරම්භකර 2023 දෙසැම්බර් 15 දින වැඩ නිමකිරීමට ගිවිසුම්ගතව තිබුණු අම්පාර සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය සියයට 52 ක භෞතික කාර්යසාධනයක් හා රු. මිලියන 64.27 ක මූල්‍ය කාර්යසාධනයක් ළඟාකර ගැනීමෙන් අනතුරුව වැඩ නවතා තිබීම හේතුවෙන් ඒ සඳහා දරන ලද වියදම නිශ්කාර්යය වියදමක් වී තිබුණි.	මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරිම සඳහා NOR කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කලද, ඒ සඳහා අනුමැතිය නොලද බැවින්, ක්‍රියාත්මක නොවූ අතර 2024 වර්ෂයේ වෙන්වූ ප්‍රතිපාදන මත ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.	මෙම ව්‍යාපෘතිය සක්‍රීය කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ඉ)	රු.මිලියන 83.60 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත 2021 ඔක්තෝබර් 06 දින වැඩ ආරම්භකර 2023 අගෝස්තු 31 දින වැඩ නිමකිරීමට තිබූ මාලිම්බොඩ වතු නිවාස ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දින වන විට සියයට 35 ක භෞතික ප්‍රගතියක් ළඟාකරගෙන තිබූ නමුත් 2024 වර්ෂය සඳහා කිසිදු කාර්ය සාධනයක් ළඟා කරගෙන නොතිබුණි.	මෙම ව්‍යාපාතියේ ඉතිරි වැඩ කටයුතු නිම කිරිම සඳහා ප්‍රතිපාදන නොලැබීම මත නැවත ආරම්භ කිරීමට නොහැකි වූ අතර, සබරගමුව පළාත් සභාවේ ප්‍රතිපාදන මත ඉතිරි වැඩ කොටස් නිම කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමට කටයුුතු කරනු ඇත.	මෙම ව්‍යාපෘතිය සක්‍රීය කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ඊ)	නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 පෙබරවාරි 08 දින වැඩ ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 39,057 ක් වූ නිවාස 1768 කින් යුතු නිවාස ව්‍යාපෘති 06 ක් 2023 දෙසැම්බර් 31 දිනට සියයට 23 කට අඩු කාර්යසාධනයක් ළඟා කරගෙන තිබිය දී	ආර්ථික අර්බුදය සමඟ මෙම ව්‍යාපෘතිවල ඉදිකිරීම් පිරිවැය ඉහලයාම නිසා කොන්ත්‍රාත්කරුවන් සමඟ සමූහික එකඟතාවය මත තාවකාලිකව ඉදිකිරීම් අත්හිටුවන ලදී. ව්‍යාපෘති 03 ක් සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ හෝ කොන්ත්‍රාත්කරු	මෙම ව්‍යාපෘතිය සක්‍රීය කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

අතරමග නවතා දමා තිබුණි.	සමග අලෙවිකරණ යෝජනා ඉදිරිපත් කොට ඒ පිළිබඳව එකඟතාවයන් සඳහා සාකච්ඡා පවත්වා ඇත . තවත් නිවාස ව්‍යාපෘති 02 ක් සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව පදනම (PPP) යටතේ තරඟකාරී ව්‍යාපෘති යෝජනා කැඳවීම් (RFP) සිදුකිරීමට පියවර ගනු ඇත.

4.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම සඳහා රු.මිලියන 2,142.48 ක කොන්ත්‍රාත් වටිනාකමකට පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. මෙම ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 10 දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 09 දින නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් නියමිත කාලසීමාව තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. එබැවින් අංක 22/1286/604/022 හා 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිමකිරීමේ වගකීමත් සමඟම සමස්ථ ගොඩනැගිල්ල යාපනය නගර සභාවට පැවරීමට තීරණය කර තිබුණ ද අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. කෙසේවුවද 2024 ඔක්තෝබර් 09 දින දක්වා	මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීම පිළිබඳ කමිටුවේ (RAMP) තීරණය මත අඩක් නිමකරන ලද මෙම ව්‍යාපෘතිය යාපනය නගර සභාව විසින් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) විසින් ව්‍යාපෘතිය නිම කිරීම සඳහා සුදුසු විසඳුමක් උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය සමඟ සාකච්ඡා කර, සලකා බලන ලෙස අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දෙන ලදි. ඒ අනුව, ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය පිරිවැය ගණනය කිරීමේදී එය ආසන්න වශයෙන් රු. මිලියන 2082ක් වැයවන බව හඳුනාගන්නා ලදි. එබැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදියර 3ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල අතර, එ සඳහා ජාතික මෙහෙයුම් මැදිරියේ හා ව්‍යාපෘති ආයෝජන,	මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළයුතු අතර අමාත්‍යාංශය මගින් සිදු කරන ලද වියදම්වල ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

දින 1,125 ක දින දීර්ඝ කිරීම් 04 ක් ලබා දීමට හා ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 3,769 දක්වා රු.මිලියන 1,627 කින් වැඩිකිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු නැවත අදියර 1 හා 2 වශයෙන් කොටස් 2 ක් යටතේ නිම කිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවුවද ව්‍යාපෘතිය ආරම්භකර වසර 6 කට ආසන්න කාලයක් ගතවී ඇතත් 2024 දෙසැම්බර් 31 වන විටද මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 85 ක් හා මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 1,819.64 ක් වී

තිබුණි. නමුත් සමස්ථ ව්‍යාපෘතිය නිමකිරීමට අවශ්‍ය ඉතිරි වැඩ කොටස් හඳුනාගෙන සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කිරීමට සහ ඒ සඳහා අදාළ අනුමැතිය ලබාගැනීමට ව්‍යාපෘතියේ උපදේශක ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. එම අධිකාරිය සතුව ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැතිවීම මෙම ව්‍යාපෘතියේ දුර්වල කාර්යය සාධනයට බෙහෙවින් බලපා තිබුණු නමුත් අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වා එම ආයතනයට උපදේශන ගාස්තු ලෙස රු.මිලියන 98.66 ක මුදලක්ද ගෙවා තිබුණි.

කළමනාකරණය හා ඇගයීම පිළිබඳ කමිටුවේ එකඟතාවය (PIMEC) ලබාගැනීමට කටයුතු කරනු ඇත.

4.6 විදේශීය ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොළඹ නාගරික පුණර්ජීවන ව්‍යාපෘතියට සහය දැක්වීමේ ව්‍යාපෘතිය (SCURP)		
(i)	අරමුදල් භාවිතයේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් ඇ.ඩො. මිලියන 200 ක ණය මුදලින් ඇ.ඩො. මිලියන 70ක් අඩු කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. මේ අනුව 3 වැනි අදියරේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අත්හිටුවා තිබූ අතර නිවාස ප්‍රතිලාභීන් සංඛ්‍යාවද 1,272 කින් අඩු කර තිබුණි. තවද ඇ.ඩො.මිලියන 42 ක් වූ ශ්‍රී ලංකා රජයේ දායකත්වය ඇ.ඩො.මිලියන 28 දක්වා ඇ. ඩො.මිලියන 14 කින් අඩු කර තිබුණි. සංශෝධිත ගිවිසුමට අනුව ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහා පුද්ගලික හවුල්කාර දායකත්වය ඉවත් කර තිබුණි.	හදිසි ඖෂධ සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ණය මුදල සහ රජයේ දායකත්වය අඩු කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලැබුණි. පසුව, නැවතත් ඇ. ඩො. මිලියන 28 ක් ලබාදීම සඳහාද කැබිනට් අනුමැතිය ලැබුණි. ඇ. ඩො. මිලියන 28 ක් භාවිතා කිරීම සඳහා සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනා සකස් කර ඇති අතර ඒ සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ AIIB බැංකුවේ කැමැත්තද ලබාගෙන ඇත.	අරමුදල් කාර්යක්ෂමව භාවිතා කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර අරමුදල් භාවිතය සඳහා විධිමත් සැලසුම් සකස් කළ යුතුය.

(ii)	ව්‍යාපෘතියේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කර 2024 දෙසැම්බර් 31 වන විට වසර 05 ක් ගතවී තිබුණද ව්‍යාපෘතියේ සංශෝධිත ණය මුදල වන ඇ. ඩො. මිලියන 130 ක මුදලින් ඇ. ඩො. මිලියන 77.28 ක් එනම් සියයට 59 ක් පමණක් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. *නමුත්* 2024 දෙසැම්බර් 31 වන දින දක්වා රු. මිලියන 562 ක කැපවීමේ ගාස්තුවක් සහ රු. මිලියන 3,653.17 ක පොලියක් ගෙවීමට සිදුව තිබුණි.	සියලුම උප ව්‍යාපෘති 2020 සහ 2021 වර්ෂවලදී ආරම්භ කර ඇත. එබැවින් කොවිඩ් 19 වසංගතය ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය අඩු වී ඇත. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය මත ණය ලබාදෙන ආයතනය විසින් ණය ගෙවීම් නිකුත් කරන බැවින් ණය මත ණය පොලිය ද ගෙවීමට සිදුවනු ඇත.	වසංගත තත්වයන්හිදී ලබා දුන් සහනයන්ද ප්‍රයෝජනයට ගනිමින් හා නියමිත කාලසීමාව තුල අරමුදල් ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකෙරෙන කොළඹගේ මාවත නිවාස ඒකක 624 ඉදිකිරීමේ ව්‍යාපෘතිය, 2024 දෙසැම්බර් 17 වන දින අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වුවද 2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 5,145.03 ක් වැය කර තිබුණද කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන අපජල පද්ධතියට අපජල සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකිවීම නිසා මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	ව්‍යාපෘතියෙන් සියයට 97 ක්ම අවසන් කර ඇති අතර ඉතිරි සියයට 3 ක වැඩ කටයුතු ප්‍රමාද වී ඇත්තේ කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන අපජල පද්ධතියට අපජල සම්බන්ධතාවයක් ඉදිකිරීම නිසා වන අතර එය ද ආරම්භ කර ඇති අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත පිරිවැය තුළ කළමනාකරණය කළ හැකිවනු ඇත.	නියමිත කාල රාමුව තුළ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට පියවර ගත යුතුය.
(iv)	මෙම ව්‍යාපෘතිය යටතේ ඉදි කෙරෙන ස්ටේඩියම්ගම නිවාස 1000 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින නිම කල යුතුව තිබුණි. එදින වන විට රු.මිලියන 9,039.12 ක් වැයකර	ව්‍යාපෘතියේ මලාපවහන සම්බන්ධතා ගැටළුව විසඳීමට ප්‍රමාද වීම නිසා ව්‍යාපෘතියේ ඉතිරි වැඩ ප්‍රමාද විය.	ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.

	තිබුණද එම නිවාස ව්‍යාපෘතියට මලාපවහන සම්බන්ධතා ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කර එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකිවී තිබුණි.		
(v)	මෙම ව්‍යාපෘතිය යටතේ ඉදි කෙරෙන, ඇපල්වත්ත නිවාස 700 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, 2023 ඔක්තෝබර් 17 දින නිමකිරීමට නියමිතව තිබුණි. නමුත් 2024 දෙසැම්බර් 31 වන විට ලබා ගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 40.47 ක් පමණක් විය. ඉතා අඩු ප්‍රගතියක් ලබාගෙන තිබූ මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම, අලුත් කර, 2025 ඔක්තෝබර් 25 දක්වා කාලය දීර්ඝ කර තවත් රු.මිලියන 389 ක අත්තිකාරමක් ලබා දීමෙන් කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ධාරිතාව ශක්තිමත් කර තිබුණි.	ව්‍යාපෘතියේ ප්‍රගතිය වේගවත් කිරීම සඳහා වහාම පියවර ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇති අතර, මෙම තත්වය මඟහරවා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, උපදේශන ආයතනය සහ අමාත්‍යාංශය විසින් දැනටමත් හැකි සෑම පියවරක්ම ගෙන ඇත. කොන්ත්‍රාත්කරු විසින් අමතර අත්තිකාරමක් සඳහා කරන ලද ඉල්ලීම් කිහිපයක් සලකා බලා, අවශ්‍ය බැංකු ඇපකර ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක අමතර අත්තිකාරමක් එස්ක්‍රෝ ගිණුමක් හරහා මුදා හැරීමට තීරණ කර ඇත.	ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම තුලින් ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.
(vi)	මෙම ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීමට නියමිතව තිබුණු රු.මිලියන 4,510.91 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිත ෆර්ගියුසන් මාවත නිවාස ව්‍යාපෘතිය, 2024 ජනවාරි 04 දින නිමකිරීමට නියමිතව තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට එහි ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 13.21ක ඉතා ඉතා පහල අගයක් ගෙන තිබුණි.	කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි, බැංකු ඇපකරයක් ලබා ගැනීමෙන් පසු, කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක අමතර අත්තිකාරමක් එස්ක්‍රෝ ගිණුම හරහා මුදා හැරීමට තීරණය කරන ලදී. නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු කඩිනම් කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව නිවැරදි කිරීමේ දැන්වීම ද	ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම තුලින් ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

	නමුත් අමාත්‍යාංශය විසින් 2024 දෙසැම්බර් 31 දින මෙම ව්‍යාපෘතියේ ගිවිසුම සංශෝධනය කර රු.මිලියන 392.25 ක අත්තිකාරමක් ලබා දී කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ධාරිතාවය ශක්තිමත් කර තිබුණි.	කොන්ත්‍රාත්කරු වෙත යවන ලදී. ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය සම්බන්ධ තීරණයක් ගැනීම සඳහා අවධානය යොමු කර ඇත.	
(vii)	කොළඹ නාගරික පුණර්ජීවන ව්‍යාපෘතියට සහය දැක්වීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට සැලසුම් කල මාදම්පිටිය නිවාස 700 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 4,529.26 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු 2024 දෙසැම්බර් 16 දින වන විට නිම කල යුතු විය. නමුත් 2024 දෙසැම්බර් 31 වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 44.20 ක් පමණක් විය.	කොවිඩ් 19 වසංගතයෙන් පසුව රටේ ඇති වූ ආර්ථික අවපාතය මෙම ව්‍යාපෘතියේ ප්‍රගතියට ද අහිතකර ලෙස බලපෑවේය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් උපදෙස් දී ඇති පරිදි ව්‍යාපෘතියේ ප්‍රගතිය වේගවත් කිරීමට කොන්ත්‍රාත්කරු පියවර ගෙන ඇති අතර 2025 අප්‍රේල් අවසානය වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 52.23 ක් වී ඇත.	ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම තුලින් ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.
(viii)	ඔබේසේකරපුර නිවාස ඒකක 300 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු, මහල් 14 ක ගොඩනැගිල්ලේ පාදම සහ අත්තිවාරම පමණක් ඉදිකර 2022 වර්ෂයේදී වැඩ අත්හිටුවා තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවක් හරහා නව කොන්ත්‍රාත්කරුවෙකු කඩිනමින් හඳුනා ගැනීමට 2022 සැප්තැම්බර් 05 දිනැති අංක 22/1177/618/007 දරන කැබිනට් අනුමැතිය ලැබී තිබුණද, විගණන දිනය වන විටද ඔබේසේකරපුර නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබූ අතර	නැවත ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය නැවත ආරම්භ කර ඇත. කොළඹ නාගරික පුණර්ජීවන ව්‍යාපෘතියට සහය දැක්වීමේ ව්‍යාපෘතිය වෙත වෙන් කරන ලද ඇ. ඩො. මිලියන 28 න් අවශ්‍ය අරමුදල් භාවිතා කිරීමට ණය ලබාදෙන ආයතනය විසින් කැමැත්ත ලබා දී ඇත.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට හා ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

	ඉදිකරන ලද කොටස් තවදුරටත් දිරාපත් වෙමින් පැවතුනි.		
(ix)	කොන්ත්‍රාත්කරුගේ ඌණ කාර්යයසාධනය මත අතරමග නතර කරන ලද මෙම ව්‍යාපෘතිය, කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ක්‍රමානුකූලව අනුගමනය කිරීමෙන් තොරව අවලංගුකිරීම නිසා රු.මිලියන 294.53 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවී තිබුණි. නමුත් ශ්‍රී ලංකා රජයට සිදු වූ එම අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104 සහ 105 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා මේ සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අදාළ මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අමාත්‍යාංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ගිවිසුමේ උප වගන්ති අංක 21.5 අනුව, හිමිකම් සමාලෝචන කමිටුවක් පත් කිරීමට පියවර ගෙන ඇත.	කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූල නොවීම සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අදාළ මුදල් අයකර ගැනීමට නොපමාව පියවර ගත යුතුය.
(ආ)	නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය (UPPF)		
	ඩොලර් මිලියන 200 ක ණයක් ලබා දීමට අවශ්‍ය මූලික සැලසුම් සකස් කිරීම සඳහා උපදේශන කටයුතු සිදු කිරීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ.ඩො. මිලියන 5.27 කට සමාන රු.මිලියන 1,064.79 ක ණයක් ලබා දී තිබුණු අතර එම මුදලින් 2024 දෙසැම්බර් 31 දක්වා රු.	මෙම විශේෂිත තාක්ෂණික සහාය 2023 ඔක්තෝබර් 31 වන දින නිල වශයෙන් වසා දමන ලදී. ඒ දිනය වන විට, ආසන්න වශයෙන් මාස හයක් ඇතුළත, උපදේශකයින් විසින් ටෙන්ඩර් සඳහා සූදානම් කර තිබූ ඇමරිකානු ඩොලර් මිලියන 9 ක් පමණ වටිනා ව්‍යාපෘති පැකේජ සකස් කිරීම අවසන් කර තිබුණි. ත්‍රිකුණාමලයේ	ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම තුළින් ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

	මිලියන 523.42 කට සමාන ඇ. ඩො. මිලියන 1.6 ක් වියදම් කර තිබුණි. ඊට අමතරව තාක්ෂණික ආධාර ප්‍රදානයක් ලෙස ඇ. ඩො. මිලියන 1 ක් ලබා දී තිබුණි. කෙසේවෙතත්, සැලසුම් කළ පරිදි වැඩ නිම කිරීමට නොහැකිවීම සහ ප්‍රදානය යටතේ තාක්ෂණික සහාය අවසන්වීම හේතුවෙන් වැඩ කටයුතු අතරමග නතර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද රු. මිලියන 523.42 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.	ව්‍යාපෘති සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මුලපිරීම සඳහා සංකල්ප සැලසුම් සහ ආරක්ෂණ තක්සේරුකිරීම් අවසන් කරන ලදී. උපදේශන ව්‍යාපෘතිය අවසන් කිරීමේදී UPPF යටතේ ක්‍රියාත්මක කරන ලද සමහර ක්‍රියාකාරකම් සම්පූර්ණ කර අමාත්‍යාංශයට භාර දෙන ලදී. ලබා දිය හැකි උපරිම තොරතුරු සහ දත්ත සහ ක්‍රියාකාරකම්වලට අදාළ ලේඛන අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ තවදුරටත් අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට නියමිත බැවින් වියදම් කළ මුදල නිෂ්ඵල වියදමක් නොවනු ඇත.	
(ඇ)	අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP)		
(i)	ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ණය සපයන ආයතනය විසින් රු.මිලියන 8,149.96 ක් හා ශ්‍රී ලංකා රජය විසින් රු.මිලියන 1,629.99 ක මුදලක් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර ව්‍යාපෘතියේ දුර්වල කාර්යාසාධනය හේතුවෙන් ව්‍යාපෘතියේ කාලසීමාව 2025 මාර්තු 31 දක්වා දීර්ඝ කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. නමුත් එම කාල සීමාව තුලද නිම කිරීමට අපේක්ෂිත වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන්	සැලසුම් උපදේශනය මාස 21 න් නිමකිරීමට අපේක්ෂා කලද ගැටළු කිහිපයක් සහ උපදේශන සමාගමක් විසින් භාවිතා කරන ලද ක්‍රියාපටිපාටිමය ගැටළු හේතුවෙන් අනපේක්ෂිත ආකාරයකින් මාස 34 ක් දක්වා ප්‍රමාද විය. 2019 දී කොවිඩ් 19 වසංගතය සහ 2020 දී ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ දුෂ්කරතා නිසා ණය පහසුකම් ප්‍රතිව්‍යුහගතකිරීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශ නියෝජිතායතනය සාකච්ඡා කර ව්‍යාපෘතියේ මුල් විෂය පථය සංශෝධනය කර ඇත.	ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම තුලින් ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

	කල නොහැකිවීම නිසා අනුරාධපුර පූජා නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින් සිදුකිරීමට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.	ඒ අනුව දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම ඇතුළුව ක්‍රියාකාරකම් කිහිපයක කටයුතු නිමකිරීම සඳහා ණය මුදල යුරෝ මිලියන 6 කට සීමා කර ඇත. නියමිත පැකේජ 12 න් පැකේජ 5 ක් සාර්ථකව නිම කර ඇත.	
(ii)	මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට සැලසුම් කල කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන1,176 (බදු රහිත) ක් වූ අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 පෙබරවාරි 24 වන දින ආරම්භ කර 2023 නොවැම්බර් 25 වන දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. නමුත් රටේ පැවති මූල්‍ය අර්බුධය හේතුවෙන් අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නවතා දමා තිබුණි. කෙසේවුවද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අවසන් කර ණය ලබා දෙන ආයතනය විසින් මුදල් දීමට එකඟවන තෙක් ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සැපයීමට එකඟ වී තිබුණද විගණිත දිනය දක්වාම එම ණය ලබා දෙන ආයතනයේ එකගතාවය ලබා දී නොතිබුණි. නමුත් මෙහි ඉදිකිරීම කටයුතු වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට රජයේ අරමුදල්වලින් රු.මිලියන 561.46 ක් වැය කර තිබුණු අතර එහි	මෙම යුරෝ මිලියන 6 ක මුදල ප්‍රංශ නියෝජිත ආයතනය විසින් ප්‍රතිපූරණ ආකාරයෙන් ලබා දෙන බවට 2024 අගෝස්තු 02 දින නිල වශයෙන් රජයට දැනුම් දී ඇත.	ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම තුලින් ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

	භෞතික ප්‍රගතිය සියයට 53 ක් විය.		
(ඇ)	කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP) වෙනුවෙන් ණය ලබාදුන් ආයතනය විසින් එ.ජ.ඩො. මිලියන 199 ක් එනම් එකග වූ මුදලින් සියයට 93 ක්ද, ශ්‍රී ලංකා රජය විසින් එ.ජ.ඩො. මිලියන 53 ක් එනම් එකග වූ මුදලින් සියයට 50 ක්ද, වැය කර 2022 දෙසැම්බර් 31 දින ව්‍යාපෘති කටයුතු අවසන් කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය සතු වත්කම් හා වගකීම් නීත්‍යානුකූලව පවරා පිලියෙල කල යුතු ඇවර කිරීමේ ගිණුම 2024 දෙසැම්බර් 31 දින වන විටද විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	පිලිතුරු ලබා දී නැත.	ව්‍යාපෘතිය නිම කර ඇවර කිරීමේ ගිණුම් පිලියෙල කර විගණන කටයුතු සඳහා නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4.7 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 33,237.76 ක් වූ කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 29 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරීමට ද පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.		

(අ)	එම ව්‍යාපෘතියේ කසළ හුවමාරු මධ්‍යස්ථානය (A), සනීපාරක්ෂක බිම් පිරවුම (B) සහ දුම්රිය මාර්ග දීර්ඝ කිරීම(C) යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු රු.මිලියන 25,577.95 (ඇ.ඩො. මිලියන 100.96) ක වටිනාකමට චීන සමාගමක් වෙත පවරා තිබුණු අතර එම සමාගම තෝරාගත් ක්‍රමවේදය විනිවිදභාවයකින් සිදුකර නොමැති බැවින් ලෝක බැංකු මගපෙන්වීම යටතේ නැවත ලංසු කැඳවන ලෙස ලෝක බැංකුව විසින් අවධාරණය කර තිබුණද අදාළ ටෙන්ඩරය අවලංගු කිරීමට නොහැකිවීම නිසා ලෝක බැංකු අධාර යටතේ වඩාත් පුළුල් ක්ෂේත්‍රයන් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවස්ථාව තිබුණු මෙම ව්‍යාපෘතියේ වැයබර ශ්‍රී ලංකා රජයට දැරීමට සිදුව තිබුණි.	ලෝක බැංකුව විසින් දන්වා තිබුණේ අදාළ ටෙන්ඩරය අහෝසි කර නැවත ටෙන්ඩර් කැඳවන ලෙසය. ඒ වන විට කසළ කළමනාකරණය හමුවේ රට තුළ පැවති උග්‍ර ගැටළුකාරී තත්වය හමුවේ නැවත ටෙන්ඩර් කැඳවීම අපහසු බව මෙම අමාත්‍යාංශය විසින් අදාළ ලෝක බැංකු නියෝජිතයන්ට දන්වන ලද අතර ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මගින් ලබාදුන් විශේෂ ආධාරයෙන් ඉතිරි මුදලද නැවත යවා ඇත.	විදේශ ආධාර මත සිදු කර ගැනීමට තිබුණු දේශීය සංවර්ධන කටයුතු සඳහා නිවැරදි ප්‍රසම්පාදන හා ටෙන්ඩර් ක්‍රම අනුගමනය නොකරන ලද වගකිවයුතු පාර්ශවයන් වෙත විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු අතර දේශීය හා විදේශී අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට හා අධීක්ෂණයට අවශ්‍ය විධිවිධාන නොපමාව සකස් කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 21,336.49 ක් වැය කර තිබුණු ව්‍යාපෘතියේ කසළ හුවමාරු මධ්‍යස්ථාන ඉදිකිරීම, සනීපාරක්ෂක බිම් පිරවුම ඉදිකිරීම සහ දුම්රිය මාර්ග දීර්ඝ කිරීම යන පැකේජ 03 හි කටයුතු පැවරුණු චීන සමාගමේ ප්‍රමාදය නිසා වරින් වර දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණු අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට එහි වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් මෙම ඉදිකිරීම් කටයුතු 2024 දෙසැම්බර් 31 වන විට ද අවසන් කර නොතිබුණි.	කැළණිය කසළ හුවමාරු මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලද සම්පීඩක 03 (Compactors) අදාළ පිලිවිතර අනුව ක්‍රියා නොකරන ලදි. තවද කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවීමට තිබූ මුදල් ගෙවීම ප්‍රමාද වීම මත ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමී ලෙස සිදුකල අතර තවදුරටත් එම මුදල් ගෙවීම ප්‍රමාද වීම මත කොන්ත්‍රාත් ආයතනය විසින් ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දමන ලදි. අදාල හිඟ මුදල් ගෙවීම් අවසන් කිරීමෙන් පසු කොන්ත්රාත් ආයතනය විසින් නැවතත් මෙම කාර්යය නිමකර ව්‍යාපෘතිය භාර දීම සඳහා සති	ව්‍යාපෘතියේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට හා ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් නිම කරවාගෙන අපේක්ෂිත ප්‍රතිලාභ ලගාකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

		23 ක කාලයක් ඉල්ලා ඇත. එම කාලය තුළ මෙම සම්පීඩක එහි මුල් ස්වරූපයෙන් ස්ථාපනය කර එහි මෙහෙයුම් සිදුකරන ආකාරය පිළබඳ පුහුණුවක්ද ලබා දීමට නියමිතව ඇත.	
(ඇ)	අවශ්‍ය කරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පැකේජය(D) සඳහා රු.මිලියන 2,963.61 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එමගින් දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මිලියන. 8.27ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර දුම්රිය දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා ලබා දී තිබුණු අතර බහාලුම් පෙට්ටි 94 ක් ඇ.ඩො. මිලියන 0.8 ක් වැයකර 2022 අප්‍රේල් 22 දින ආනයනය කර ගබඩා කර තිබුණි. දුම්රිය වැගන් 34 ක් ඇ.ඩො. මිලියන 2.3 ක වටිනාකමකට ඉන්දියන් සමාගමකින් ආනයනය කරගැනීම සඳහා 2019 ඔක්තෝබර් 21 දින ගිවිසුම් අත්සන්කර තිබුණ ද අදාළ ආයතනය විසින් ගිවිසුම් ප්‍රකාරව ව්‍යුහාත්මක සංකල්පීය සැලැස්ම ඉදිරිපත් නොකිරීම නිසා ගිවිසුම නිෂ්ක්‍රියකර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද දුම්රිය වැගන් සපයාගැනීමට නොහැකි වී තිබුණි. කෙසේවුවද 2024 දෙසැම්බර් 31 දින වන විට මෙම පැකේජය සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 2,024.21 ක්	දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය වැගන් 17ක් රු.මිලියන 549.6ක මුදලකට අලුත්වැඩියා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත්තේ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ආයෝජකයා හරහා මෙම දුම්රිය වැගන් මිළ දී ගැනීමේ හැකියාව සොයා බලන ලෙසය. කෙසේ වෙතත් දුම්රිය වැගන් මිළ දී ගන්නා තෙක් මෙම ව්‍යාපෘතිය කරගෙන යාමට අවශ්‍ය වැගන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ලබා දීමට සිය එකඟතාවය පළ කර ඇත.	ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් නිම කරවාගෙන අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

	වැයකර ලබාගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 95 ක් විය.		
(ඇ)	2024 දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශය විසින් මෙම සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 25,976.27 ක් වැයකර තිබුණ ද ව්‍යාපෘතියේ කටයුතු අවසන් වී නොමැති බැවින් ව්‍යාපෘතිය සක්‍රිය කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණුද නිරීක්ෂණය විය.		
(i)	කසළ පැටවුම් මධ්‍යස්ථානය වෙත ගෙන එනු ලබන කසළ දුම්රිය අංගනය වෙත ප්‍රවාහනය කිරීම, අරුවක්කාලු කසළ මධ්‍යස්ථානයේ සිට කසළ බිම්පිරවුම වෙත ප්‍රවාහනය කිරීම හා අනෙකුත් කාර්යයන් සඳහා ඇ.ඩො. මිලියන 8.27 ක වටිනාකමැති වාහන 44 ක් කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගෙන කසළ හුවමාරු මධ්‍යස්ථානයන්හි වාහන අංගන තුළ ගාල්කර තිබුණි. එම වාහන 2019 වර්ෂයේ මෙරටට ගෙන්වා තිබුණු අතර කොන්ත්‍රාත්තුව අවසන්කර භාරදෙන තෙක් එම වාහන වසර 05 ක පමණ කාලයක සිට නිෂ්කාර්යයව පවතී. එබැවින් මෙම වාහන අක්‍රිය තත්වයට පත්ව තිබුණ අතර වගකීම් කාලය ද ඉක්මවා ගොස් තිබුණු බැවින් ඒවා නැවත සක්‍රීය	කසළ සනිපාරක්ෂක කසළ රඳවනයේ තැන්පත් කළ දින සිට එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු වෙමින් පවතින බැවින් එම වාහන අවශ්‍යතාවය මත නිරන්තරයෙන් භාවිතා කරමින් පවතී.	වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හා මෙම වත්කම් අමාත්‍යාංශයට නීත්‍යානුකූලව භාරගෙන අමාත්‍යාංශ වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

	තත්වයට පත්කිරීමට අමතර වියදමක් දැරීමටද සිදු වී තිබුණි.		
(ii)	අරුවක්කාලු සනීපාරක්ෂක බිම් පිරවුමේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පෙර රජය විසින් ගත් ක්ෂණික තීරණයක් හේතුවෙන් 2019 අගෝස්තු සිට 2020 දෙසැම්බර් දක්වා කාලසීමාව තුළ නාගරික ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 50,000 ක් පමණ තැන්පත් කර තිබූ අතර එම කසළ මඟින් ජනනය වූ අපදියර පිරිපහදු කිරීම සඳහා ඇ.ඩො. මිලියන 1.13 ක අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.	එම අපදියර, විවෘත පොකුණු දෙකක සහ අපදියර නියාමන ටැංකි දෙකක ගබඩා කර ඇත. මෙම අපදියර පිරිපහදු කිරීම සඳහා වෙනම කොන්ත්‍රාත්තුවක් ඇ.ඩො. මිලියන 1.13 ක මුදලකට ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගත්ත ද සිදු වූ හදිසි ගංවතුර තත්වය මත අරුවක්කාලු අපදියර ප්‍රතිකර්ම පද්ධතියට දැඩි හානි සිදු විය. නමුත් මේවන විට එම කොන්ත්‍රාත් සමාගම එම පද්ධතිය නැවත ප්‍රතිස්ථාපනය කර මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව 2025 පෙබරවාරි 15 වන දින සිට ඔවුන් මෙම ගබඩා කර ඇති අපදියර පිරිපහදු කිරීම ආරම්භ කර ඇත.	ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම තුලින් ව්‍යාපෘති කාල රාමුව තුළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	අරුවක්කාලු කසළ රැඳවුම් අංගනයේ බාහිරින් එක්රැස් වන වැසි ජලය බැහැර කිරීම සඳහා කාණු පද්ධතියක් ඉදිකර නොතිබුණු බැවින් 2021 නොවැම්බර් 09 දින ගංවතුර හේතුවෙන් අරුවක්කාලු කසළ අංගනය ගංවතුරෙන් යටවීම නිසා අපදියර ප්‍රතිකර්ම මධ්‍යස්ථානයේ හා අපවායු ප්‍රතිකර්ම මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලද යන්ත්‍රෝපකරණ අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණි.	ව්‍යාපෘතියේ සැලසුමෙහි සඳහන් පුත්තලම කලපුව දෙසට වූ වර්ෂා ජල ඇළ මාර්ගය කැපීමට විරුද්ධව ප්‍රදේශවාසීගෙන් උද්ගත වූ විරෝධය හේතුවෙන් එම ඇළ මාර්ගය කැපිය නොහැකි විය. එබැවින් කොන්ත්‍රාත්කරු විසින් වර්ෂා ජල රඳවනයේ ධාරිතාවය වැඩි කරන ලද අතර ව්‍යාපෘති භූමියට බාහිරෙන් ගලා එන වර්ෂා ජලය සියල්ල වේලි දෙකක් ඉදි කිරීම මඟින් කලපුව දෙසට හරවන ලදි. අපදියර ප්‍රතිකර්ම මධ්‍යස්ථානය හා අප වායු ප්‍රතිකර්ම මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබූ හානි වූ යන්ත්‍රෝපකරණ මේ වන විට කොන්ත්‍රාත් ආයතනය විසින් බොහෝ දුරට යාවත්කාලීන	අක්‍රිය තත්වයට පත් යන්ත්‍ර යථා තත්වයට පත් කර ගැනීමට හා වැසිජලය බැහැර කිරීමට කාණු පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යයන් නොපමාව සිදුකළ යුතුය.

	කර අවසන් කර ඇති අතර, ඉතිරි ඒවාද නොබෝ දිනකින් යාවත්කාලීන කිරිමට කටයුතු කරනු ඇත.	

4.8 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) ඡේදය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරනු ලබන වාහන තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය හිමි ආයතනය වෙත විධිමත්ව පැවරීමට කටයුතු කල යුතු වුවද නීත්‍යානුකූල හිමිකම අමාත්‍යාංශය සතු නොවූ රු.මිලියන 254.82 ක් වටිනාකමැති වාහන 21 ක් අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන බව නිරීක්ෂණය විය.	එම වාහන වල හිමිකම් පවරා ගැනීමේ ගැටළු පැවතීම නිසා නීත්‍යානුකූල හිමිකම පවරා ගැනීමට ප්‍රමාද වී ඇත.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර අමාත්‍යාංශයට අවශ්‍ය වාහනවල අයිතිය නිසි පරිදි පවරාගැනීමට හා අනෙකුත් වාහන හිමිකරුවන් වෙත භාරදීමට නොපමාව කටයුතු කළ යුතුය.

4.9 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රු. මිලියන 107.3 ක කොන්ත්‍රාත් වටිනාකමැති නුවරඑළිය නානුඔයෙහි ඉවුර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 29 දින ආරම්භ	ප්‍රතිපාදන ප්‍රමානවත් නොවුණ බැවින් ව්‍යාපෘති ඉංජිනේරු අධීක්ෂණය හා උපදේශනය මත අත්‍යාවශ්‍ය කොටස් පමණක් හඳුනාගෙන ව්‍යාපෘතිය නිමකරන ලදි.	අත්‍යාවශ්‍ය ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව නිමකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතු අතර අදාළ ව්‍යාපෘතිවල සාර්ථකත්වය හා එහි ප්‍රතිලාභ පිළිබඳ පසුවිපරම් කටයුතුද
කර 2022 සැප්තැම්බර් 28 දින නිමකිරීමට ගිවිසුම්ගත වී තිබුණු අතර රු. මිලියන	මෙම ව්‍යාපෘතිය 2023 ඔක්තෝබර් 25 දින නුවරඑළිය නගර සභාව වෙත බාර දුන්	විධිමත් කළ යුතුය.

16.34 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ද ගෙවා තිබුණි. නමුත් රටේ පැවති ආර්ථික අර්බුධකාරි තත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට නියමිත දිනට ව්‍යාපෘතිය නිමකිරීමට නොහැකි වී තිබුණු බැවින් අවස්ථා 02 කදී දින දීර්ඝකිරීම් අනුමත කළද ගිවිසුම්ගත කාර්යයභාරය අවසන් කරවා ගැනීමට නොහැකිවී තිබුණි. පසුව මෙහි විෂයපථය සීමාකර නානුඔයේ පැතිබැම්ම පමණක් ඉදිකර ව්‍යාපෘතිය අවසන් කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 47.24 ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි. නමුත් නානුඔයේ පැතිබැම්ම ඉදිකිරීමේ කාර්යයද සම්පූර්ණ කිරීමට අපොහොසත්වීම නිසා ඉවුරේ ඇතැම් ස්ථාන වැලි හා අපද්‍රව්‍යවලින් වැසී ගොස් තිබුණි. තවද නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොකරන බැවින් ව්‍යපෘතිය නිමකර වසරක් ගත වීමටත් පෙර නානුඔයේ ජලය ගලායාම අවහිර වී තිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකළ රු.මිලියන 47.24 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

අතර එහි නඩත්තු කටයුතු සිදු කිරීම එම ආයතනය සතු වගකීමක් වනු ඇත.

(ආ)	කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 118.89 ක් වූ වලපනේ බහුකාර්ය ගොඩනැගිල්ල හා සතිපොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය, 2021 සැප්තැම්බර් 28 දින ආරම්භ කර 2022 නොවැම්බර් 11 දින අවසන් කලයුතු වුවද එදින වන විටද ව්‍යාපෘතියේ ගිවිසුම්ගත වැඩකටයුතු නිමකළ නොහැකිවී තිබුණු අතර 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2022 මඟින් ලබාදී ඇති උපදෙස් අනුව දෙපාර්ශවයේ එකඟතාවයෙන් රු. මිලියන 48.94 ක වැඩඅවසන් වටිනාකමක් මත ව්‍යාපෘතිය අවසන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ 2021/2022 කාලසීමාව කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට නිතිපතා වසා දැමීම හේතුවෙන් මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණපා සිටි කාලයක් බැවින් එවැනි කාල වකවානුවක අත්‍යවශ්‍ය නොවූ සහ සතියකට එක් වතාවක් පමණක් පැවැත්වෙන පොළක් ඇතුළුව, අවශ්‍යතාවය හඳුනා නොගත් බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කිරීම නිසා ඉහත දැක්වෙන පරිදි ව්‍යාපෘතිය අතරමග නැවතීමට සිදුව තිබුණු අතර මෙම ව්‍යාපෘතිය නිම	ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු 2025 වර්ෂයේදී ආරම්භ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත.	ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කළ අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කරමින් ඉතිරි වැඩකටයුතු නිමකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

	නොකර අතහැර දැමීම හේතුවෙන් ඒ වෙනුවෙන් වැය කළ රු. මිලියන 48.94 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.		
(ii)	ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.	විධිමත් පරිදි අනුමැතිය ලබාගැනීමේ යම් යම් අඩුපාඩු සහිතව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද නමුත් පසුව එම අඩුපාඩු නිවැරදි කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.	මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	රු.මිලියන 54.62 ක් වැයකරන ලද නුවරඑළිය පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් 14 දින අවසන්කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා දින දීර්ඝ කිරීම් 7 ක් ලබා දී තිබුණු අතර 7 වන දින දීර්ඝ කිරීම සඳහා 2020 ජූලි 10 දක්වා දින 265 ක් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබුණද උපදේශන ආයතනය විසින් දින 256 ක් නිර්දේශ කර තිබුණු අතර 2019 දෙසැම්බර් 15 දින දක්වා දින 48 ක් සඳහා පමණක් අමාත්‍යංශ ලේකම්වරයා විසින් අනුමැතිය ලබාදී ඉතිරි ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 4.32ක් අයකර ගෙන තිබුණි. නමුත් ප්‍රමාද ගාස්තු අයකිරීමට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් නිරවුල් කිරීමේ විනිශ්චය මණ්ඩලයේ පවරා තිබුණු නඩුවට ලද තීන්දුව අනුව, වැඩිපුර අයකරන ලද ප්‍රමාදගාස්තු හා ඊට අදාළ පොලිය ලෙස රු.මිලියන	ආරවුල් නිරවුල් කිරීමේ විනිශ්චය මණ්ඩලය මගින් සිදු කරන ප්‍රශ්න කිරීම් හමුවේ ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට හැකි පළපුරුදු හා ප්‍රවීන නිලධාරීන් නොමැතිවීම මීට හේතු වී ඇත. මීට පෙරදීද මෙවැනි ආරවුල් නිරවුල් කිරීම් හමුවේ අමාත්‍යාංශය වෙත ලැබී ඇති තීරණ මගින්ද මේ සම්බන්ධව වඩාත් පැහැදිලි වී ඇත.	ඉදිකිරීම් කටයුතුවලට අදාළ නීතිරීතිවලට අනුකූල වන පරිදි තීරණ නොගත් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන මෙම අතිරේක වියදම් අයකර ගැනීමට කටයුතු කළයුතු අතර එම අංශයන් සවිමත් කිරීමටද නොපමාව කටයුතු කළ යුතුය.

	5.31 ක් අමාත්‍යාංශය විසින් 2024 ජූලි 22 දින කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ආරවුල් නිරවුල් කිරීමේ විනිශ්චය මණ්ඩලය හමුවේ අමාත්‍යාංශයේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට හැකි ශක්තිමත් නීති නිලධාරීන් පත්කර ගැනීමට අපොහොසත්වීම නිසා අමාත්‍යාංශයට ඉහත පරිදි අතිරේක වියදමක් දැරීමට සිදුව තිබුණි.		
(ඇ)	නැනෝ + ආර්ඕ තාක්ෂණය යොදා ගනිමින් පානිය ජලය ලබාදීමේ වැඩසටහනට අදාල රු. මිලියන 219.1 ක් 2024 දෙසැම්බර් 31 දින වනවිට ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණි. 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා රු. මිලියන 188.1 ක මුදලක් වැය කර වවුනියාව කිලිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්කවල ජල පිරිපහදු පද්ධතීන් 50 ස්ථාපිත කර තිබුණ ද ඒවා ක්‍රියාකාරී තත්ත්වයට පත්කර වකුගඩු රෝගීන් වෙත ලබාදීමට අමාත්‍යාංශය විසින් කටයුතු නොකිරීම හේතුවෙන් එම වත්කම් ඌන උපයෝජිතව පැවතුණි.	මෙම දිස්ත්‍රික්ක වල නැවත පදිංචි කළ ජනතාවට ආරක්ෂිත පිරිසිදු ජලය පානය කිරීමේ ඇති අවශ්‍යතාවය හා වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය අඩු බවක් දක්නට ඇත. මෙම ව්‍යාපෘති 50 අතරින් ව්‍යාපෘති 6 ක් ඌන උපයෝගීතාවයෙන් යුතු බව පිළිගන්නා අතර මෙම ව්‍යාපෘති වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	ව්‍යාපෘති සඳහා යොදාගන්නා මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කර පිරිපහදු පද්ධති ක්‍රියාකාරී තත්වයට පත්කිරීමෙන් පිරිසිදු පානීය ජලය ජනතාව වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඈ)	අමාත්‍යාංශය පවත්වා ගෙන යාම සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැතිවීමෙන් අමාත්‍යාංශය ආරම්භ කල 2015 වර්ෂයේ සිටම කාර්යාලය තාවකාලික ගොඩනැගිලිවල ස්ථාපිත කරමින් විශාල ප්‍රතිස්ථාපන	නව ඉදිකිරීම් සඳහා වියදම් පාලනය යටතේ අනුමැතිය ලබා දී නොමැති නිසා මේ සඳහා කටයුතු කර නොමැත.	නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය ස්ථිර ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීමෙන් හෝ වෙනත් පියවරක් අනුගමනය කිරීමෙන් අමාත්‍යාංශය පවත්වා ගැනීමට දරනු ලබන වියදම් අවම කරගැනීමට කටයුතු කළ යුතුය.

මුදලක් හා බදුකුලියක් ගෙවමින් අමාත්‍යාංශය පවත්වාගෙන ගොස් තිබුණි. වර්තමානයේද නාගරික සංවර්ධන අධිකාරිය සතු ගොඩනැගිලි දෙකක මහල් කිහිපයක් කුලීපදනමට ලබාගෙන පවත්වාගෙන යනු ලබන අතර 2024 වර්ෂය වෙනුවෙන් එම අධිකාරියට ගොඩනැගිලි කුළී ලෙස රු.මිලියන 201 ක් පමණ ගෙවා තිබුණි. නමුත් නාගරික සංවර්ධන අධිකාරියද මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන බැවින් වඩාත් සාධාරණ ක්‍රමයට සකස්කරවා ගැනීමට හෝ අමාත්‍යාංශය සුදුසු ස්ථිරසාර ගොඩලැගිල්ලක ස්ථාපිත කර ගැනීමට හෝ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

4.10 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන විමසුම පිළිබඳ විස්තරය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 වර්ෂය තුල නිකුත් කරන ලද විගණන විමසුම් 09 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. තවද 2024 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 20 කට පිලිතුරු ලබාදීමේදී දින 19 සිට 310 දක්වා අතර කාල පරාසයක ප්‍රමාදයක් පැවතුණි.	අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන බොහොමයක් ව්‍යාපෘති කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හරහා සිදුකෙරේ. එම ව්‍යාපෘති හා ආයතන සම්බන්ධ විගණන විමසුම් වලට අදාල මූලික තොරතුරු එම ආයතනවලින් ලබා ගෙන අධ්‍යනය කර , පිලිතුරු සකස් කිරීම සඳහා යම් කාලයක් ගත වන බව අමාත්‍යාංශය විසින්ද හඳුනාගෙන ඇත. එම තත්වය අවම කර ගැනීමට මේ වන විටත් කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි 155 සහ 452(1) අනුව විගණන විමසුම් ලේඛනය පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර 2018 අංක 19 දරන විගණන පනතේ 38(1) වගන්තිය අනුව එම විමසුම්වලට නිෂ්චිත කාලයක් තුළ පිළිතුරු ලබාදෙන බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතුය. එසේ පිළිතුරු ලබාදීම ප්‍රමාද විය හැකි විමසුම් වේනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට ද කටයුතු කළ යුතුය.

4.11 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුරුණෑගල රජපිල්ල නාගරික උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 164.13 ක මුදලක් ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ අවස්ථාව වන විට එහි මුළු පිරිවැය රු.මිලියන 169.9 ක් වී තිබිණි. නමුත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී තිබුණේ රු.මිලියන 24.3 ක සීමාවක් දක්වා පමණි. නමුත් එම සීමාව ඉක්මවූ රු.මිලියන 145.6 ක මුදල සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද කොන්ත්‍රාත් ආයතනයට රු.මිලියන 164.13 ක මුදලක් ගෙවීමේ දී මුදල් රෙගුලාසි අංක 136 හා 138 යන රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	ඒ සම්බන්ධව මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගන්නා ලෙස 2025 පෙබරවාරි 13 දිනැති ලිපිය මඟින් උපදෙස් දී ඇත. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. ඒ අනුව මුදල් රෙගුලාසි 136 හා 138 අනුව කටයුතු කර නොමැති බවට දැක්වීම නිවැරදි නොවනු ඇත.	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ නීතිරීතිවලට අනුකූල විය යුතු අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන විගණනයට ඉදිරිපත් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ආ)	නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ නැවත පදිංචි කිරීමේ අංශයේ සේවය කරන සංවර්ධන නිලධාරීන් 39 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 06 කට	උතුරු නැගෙනහිර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල රාජකාරී කරන ලද නිලධාරීන්ට ගෙවන ලද වැටුප් පත්‍රිකා සියල්ල අදාල නිලධාරීන් විසින් අත්සන් කර ඇති අතර, එම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ කාර්යසාධන ඇගයීම නොපමාව සිදු කළ යුතු අතර පැමිණීමේ හා නිවාඩු විස්තර ආයතන සංග්‍රහයේ විධිවිධාන

	හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 කට අනුයුක්ත කර තිබුණද ඔවුන්ගේ කාර්යයසාධනය ඇගයීමට ලක්කර නොතිබුණු බැවින් අදාල නිලධාරීන් එකී කාර්යාල වෙත අනුයුක්ත කිරීමෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා තිබුණු බවට විගණනයේදී අනාවරණය නොවුණි. මෙම නිලධාරීන් අදාල සේවා ස්ථානවලට වාර්තා කිරීම සම්බන්ධ තොරතුරු නැවත පදිංචි කිරීමේ අංශයේ පවත්වාගෙන ගොස් නොතිබුණු අතර අදාල නිලධාරින්ගේ නිවාඩු විස්තරද ක්‍රමවත්ව නඩත්තු කර නොතිබුණි. ඒ අනුව එකී නිලධාරීන්ගේ සේවයට වාර්තා කිරීමද තහවුරු කර ගැනීමකින් තොරව ඔවුන්ට වැටුප් ගෙවීම් සිදුකර තිබුණි.	තොරතුරු 2024 මැයි 27 දින විගණනයට ලබා දී ඇත.	ප්‍රකාරව පවත්වා ගෙන ඊට අනුකූල වැටුප් සැකසීමේ හා ගෙවීමේ කටයුතු කළ යුතුය.
(ඇ)	නාගරික සංවර්ධන,ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවලට එරෙහිව දැනට අධිකරණයේ නඩු 07 ක් විභාග වෙමින් පවතින අතර එයින් නඩු 05 ක් සම්බන්ධයෙන් ඉදිරියේදී රු.මිලියන 6,137 ක් ගෙවීමට සිදුවෙතැයි 2024 ගිණුම් ප්‍රකාශනවල අනාවරණය කර තිබුණි. එම නඩු කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශයට අවාසිදායක තින්දු ලැබුණහොත් එය අනාගතයේදී රජයට අමතර වැයබරක් වනු ඇති බව නිරීක්ෂණය විය.	නඩු කටයුතුවල ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.	නඩු කටයුතු අවම වන ආකාරයට පරිපාලන කටයුතු මෙහෙයවිය යුතු අතර පවතින නඩුවලින් අමාත්‍යාංශයට වාසිදායක තීන්දුවක් ලබා ගැනීමට හැකි සියළු උත්සාහයන් දැරිය යුතුය.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තලවාකැලේ නගරයේ භූ අලංකරණ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 16.15 (බදුරහිත) ක් වැය කර තිබුණි. නමුත් එම භූමිය හා ඇවිදීමේ මංතීරුව කිසිදු නඩත්තු කටයුත්තක් සිදු නොකිරීම හේතුවෙන් වල්බිහිවී තිබුණු අතර ව්‍යායාම සඳහා භාවිතා කළ නොහැකිව තිබුණි. තව ද එම භූමියේ ගස් 90 ක් සිටුවීම සඳහා රු මිලියන 0.25 ක් වැයකර තිබුණද එවැනි ගස් සිටුවීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව, මෙම සංවර්ධන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත තලවකැලේ නගරය වෙත සංචාරකයින් ආකර්ෂණය කරගැනීමේ මූලික අරමුණ ඉටු වී නොතිබුණු අතර මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයා වෙත ද ලැබී නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී සියක් නගර වැඩසටහන යටතේ තලවකැලේ ලිඳුල නගර සභාවේ ඉල්ලීමක් මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර, සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කර 2022 පෙබරවාරි 21 ලිඳුල නගර සභාව වෙත භාර දෙන ලදි. ඒ අනුව ඉදිකිරීම් පරිශ්‍රයේ නඩත්තු කටයුතු ලිඳුල නගර සභාව විසින් සිදුකල යුතු බව දැනුම් දෙමි.	අදාළ ආයතන සම්බන්ධ කර ගනිමින් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයා වෙත ලබාදීමට සැලැස්විය යුතුය.